Copyrighted Material

# පළමුවැනි පරිච්ඡේදය

## කෙනා

එයා මැරුණු දිනේ සටහන් කරපු පුංචි ලී කුරුසියක් පාර අයිනට වෙන්න හිටවලා තිබුණා.

ස්කොටී නම් මේකට කොහෙත්ම කැමතිවෙන එකක් නෑ. ඕනේ ඔට්ටුවක්, එයාගෙ අම්මා තමා ඕක මෙතැන හිටවන්න ඇත්තේ.

"ඔතැන ඉස්සරහින්, පොඩ්ඩක් නවත්තන්න පුළුවන්ද?"

රියදුරා වේගය බාල කරලා, කැබ් එක නතර කළා. මම වාහනෙන් බැහැලා, කුරුසිය තිබුණ තැන වෙනකල් ආපස්සට ඇවිදගෙන ගියා. ඊටපස්සෙ ඒක වටේට තිබුණ පස් බුරුල් වෙනකල් දෙපැත්තට හොලවලා, කුරුසිය පොළොවෙන් උඩට ඇදලාගත්තා.

*එයා මැරුණෙ හරියටම මෙතැනමද? නැත්නම් පාරෙද?*

පූර්ව නඩු විභාගයෙදි කියැවුණු විස්තරවලට මම ඒ හැටි අවධානයක් දුන්නෙ නෑ. එයා කාර් එකෙන් යාර කීපයක් ඈතට බඩගාගෙන ගිහින් තියෙනවා කියලා චෝදකවරයා කියද්දිම, මම සින්දුවක් මුමුනන්න පටන්ගත්තා. ඉතින්, එයා ඊටපස්සෙ කියපු කිසිම දෙයක් මට ඇහුණේ නෑ. මේ නඩුව, නඩු විභාගයක් වෙනකල් දුරදිග ගියා නම්, මට සිද්ධවෙන්නේ ඔය විස්තර එකක් නෑරම අහගෙන ඉන්න. ඒකෙන් ගැලවෙන්න තිබුණ වුවමනාවට මම කළේ මං 'වැරදිකරු' බව පිළිගත්ත එක.

කොහොමත්, එකඅතකින් බැලුවාම මම වැරදිකරු තමයි.

එයා මැරුණේ මං කරපු දෙයක් නිසා නොවෙන්න ඇති. **හැබැයි සහතිකේටම, එයා මැරුණේ මං කිසිම දෙයක් නොකරපු නිසා!**

MUSESBOOKS®

Copyrighted Material



*මං හිතුවේ ඔයා මැරිලා කියලා, ස්කොටී. ඒත් මැරුණු මිනිස්සුන්ට බඩගාන්න බැනෙ!*

කුරුසියත් අතේ තියාගෙන ආපහු කැබ් එක ළඟට ඇවිදගෙන ගිය මම, ඒක මට එහා පැත්තෙන් තියාගෙන පිටිපස්සේ සීට් එකෙන් වාඩිවුණා. මං බලන් හිටියේ රියදුරා වාහනේ ආයෙමත් පාරට ගන්නකල්. ඒත් මිනිහා වාහනේ ගන්න පාටක්වත් නෑ. වාහනේ පිටිපස්ස බලන කණ්ණාඩියෙන් මං එයා දිහාට බැල්මක් දානකොට, මිනිහත් ඇහිබැමකුත් උස්සගෙන මගේ දිහා බලාගෙන ඉන්නවා.

"පාර අයිනෙ තියෙන ස්මාරක හොරකම් කරන එක නම් ඒ හැටි සුබ දෙයක් නොවෙන්න පුළුවන්. ඕක ගෙනියන්න ඕනෙ කියලා ඔයාට හොඳටම විශ්වාසද?"

මං මූණ එයාගෙන් අහකට හරවගෙන, බොරුවක් අතෑරලා දැම්මා. "ඔව්, මමයි ඒක එතන හිටෙව්වෙ."

වාහනේ ආපහු පාරට ගන්නකොටත්, රියදුරාගේ ඇස් මගේ දිහාටම ඇලිලා තියෙනවා මං හොඳටම දැක්කා.

මගේ අලුත් අපාර්ට්මන්ට් එකට මෙතැන ඉඳන් හැතැප්ම දෙකක් විතරයි තියෙන්නේ. ඒත් ඒක තිබුණෙ මං කලින් හිටපු දිහාවට ප්‍රතිවිරුද්ධ පැත්තේ. මට කාර් එකක් නැති හින්දා මං හිතුවා, මේ වතාවේ නගරෙ මැද හරියට කිට්ටු තැනක්ම හොයාගන්න. එතකොට මට පයින්ම වැඩට යන්න පුළුවන්නෙ. ඒ ඉතින් මට රස්සාවක් හොයාගන්න පුළුවන් වුණොත් තමයි. මගේ අතීත කතන්දරයි, අත්දැකීම් අඩුකමයි එක්ක රස්සාවක් හොයාගන්න එකනම් කොහොමටවත් ලේසිපාසු වැඩක් වෙන එකක් නෑ. ඒ මදිවට, කැබ් එකේ රියදුරා කිව්වා වගේ, මං දැන් මේ අසුබ විපාකෙකුත් අරගෙනනේ යනවා ඇත්තේ.

ස්කොටීගේ ස්මාරකය හොරකම් කරපු එක අසුබ දෙයක් වෙන්න ඇති. ඒත්, ජීවත්වෙලා ඉන්නකල්ම, පාර අයිනේ ස්මාරක හදන එකට තමන් කොයිතරම් අකමැතිද කියලා වචනෙන්ම කියපු මනුස්සයෙක් මැරුණාම, එයා වෙනුවෙන් ඒ විදියෙම ස්මාරකයක් හදන එක අන්තිම නරක දෙයක් කියලත් කෙනෙකුට තර්ක කරන්න පුළුවන්. අනතුර සිද්දවුණු තැන ග්‍රේස් මොනවහරි තියලා ගිහින් ඇති කියලා මම දැනන් හිටියා.

අන්න ඒ නිසාමයි මම සාමාන්‍ය පාරෙන් නොයා, මේ පිට පාරෙන් එමු කියලා රියදුරාට කිව්වේ. එහෙම දෙයක් තියෙනවා නම්,

www.musesbooks.com

Copyrighted Material



ස්කොටී වෙනුවෙන් ඒක අයින් කරලා දාන එක මගේ යුතුකමක් කියලයි මට හිතුණේ.

"කැෂ්ද? කාඩ්ද?" රියදුරා මගෙන් ඇහුවා.

වාහනේ නැවැත්තුවට පස්සේ මීටරේ දිහා බලපු මම, සල්ලියි, සන්තෝසම් මුදලකුයි පර්ස් එකෙන් එළියට ඇදලා අරන් මිනිහගේ අතට දුන්නා. ඊටපස්සෙ මගේ සූට්කේස් එකයි, මේ දැන් හොරකම් කරපු කුරුසියයි අරගෙන කැබ් එකෙන් බැහැලා, එතන තිබුණු ගොඩනැගිල්ල දිහාවට ඇවිදගෙන ගියා.

මගේ අලුත් අපාර්ට්මන්ට් එක තිබුණේ මහා විශාල නිවාස සංකීර්ණයක නෙවෙයි. ඒක, එක පැත්තක අතෑරලා දාපු පාක් එකකුයි, අනික් පැත්තේ සිල්ලර බඩු කඩයකුයි තියෙන තනි ගොඩනැගිල්ලක්. පහළම තට්ටුවේ ජනේලයක් තුනී ලෑලි ගහලා වහලා දාලා තිබුණා. එක එක තරමට දිරපු වගේම දිරන්න නියමිතව තියෙන බියර් කෑන් ඉඩමේ තැනින් තැන විසිරිලා. මම මගේ සූට්කේස් එකේ රෝදෙක පැටලෙන්න ගිය බියර් කෑන් එකකට පයින් ගහල ඒක අහකට කළා.

මෙතැන පෙනුම කොයිතරම් නරකද කියනවා නම්, ඔන්ලයින් බලද්දි පෙනුණටත් වඩා අන්තයි. ඒත් මම, එහෙම වෙයි කියලා බලාපොරොත්තුවෙන්මයි හිටියේ. මෙතන හිස්වුණු ඉඩක් තියෙද කියලා බලන්න මම කෝල් කරපු වෙලාවේ, ගෙවල් අයිතිකාරියට මගේ නම දැනගන්නවත් ඕන වුණේ නෑ!

*'මෙතන ඕනෙ වෙලාවක හිස්වුණු ගෙවල් තියෙනවා. සල්ලි අරන් එන්න. මම ඉන්නෙ පළවෙනි අපාර්ට්මන්ට් එකේ,'* ඔන්න ඔහොම කියලා, එයා දඩස් ගාලා ෆෝන් එක තිව්වා.

මම ගිහින් පළවෙනි නිවාසෙ දොරට තට්ටු කළා. ඒ ගෙදර ජනේලේ ළඟ වාඩිවෙලා ඉඳපු පූසෙක් මගෙ දිහා බලාගෙන ඉන්නවා. ඌ කොයිතරම් නිශ්චලවද හිටියේ කියනවා නම්, ඌ පූසෙක්ද, එහෙම නැත්නම් පූසෙක්ගෙ පිළිමයක්ද කියලා මට සැක හිතෙන්න පටන් අරගෙනයි තිබ්බේ. ඒත් ඔන්න එතකොටම, ඌ ඇහිපිය ගහලා, හෙමින් පැත්තකට මාරුවෙලා ගියා.

දොර ඇරියෙ ටිකක් වයසක, ඒ හැටි උස මහතක් නැති, පුංචි ගෑනු කෙනෙක්. එයා මං දිහාට හෙළුවෙ මහ කරදරයක් දිහා බලන බැල්මක්. කොණ්ඩෙ කැරලි වෙන්න දාන 'කර්ලර්ස්' ඔළුවේ ගහගෙන හිටපු එයාගෙ නහයෙ ලිප්ස්ටික් පැල්ලමක් ගෑවිලා.

"ඔහේ විකුණන්නෙ මොනවා වුණත්, මට ඒවා ඕනෙ නෑ!"

MUSESBOOKS®

Copyrighted Material



මම බලාගෙන හිටියේ එයාගේ ලිප්ස්ටික් දිහා. ඒවා එයාගෙ රැලිගැහුණු තොල්වල ගැඹුරට තැවරිලා තිබුණේ හරියට ලේ වගේ.

"මම ගිය සතියෙ ගෙයක් ගැන අහන්න කෝල් කළා. ඔයා කිව්වා ඔයා ළඟ එකක් තියෙනවා කියලා."

ගෑනු කෙනාගේ, වේළිච්ච මිදි ගෙඩියක් වගේ මූණේ එකපාරටම මතුවුණේ මාව අඳුරගත්තා වගේ බැල්මක්. මාව උඩ ඉඳන් පහළට ආයෙම සැරයක් බලන ගමන් එයා, 'හම්ප්' සද්දයක් දැම්මා. "ඔයාට මේ වගේ පෙනුමක් තියේවි කියලා මම බලාපොරොත්තු වුණේ නෑ."

ඒ කිව්ව කතාව ගැන මම කොහොමද හිතන්න ඕනෙ කියලා මට අදහසක් තිබ්බෙ නෑ. ගෑනු කෙනා තත්පර කීපෙකට දොර ළඟින් අයින්වෙලා ගේ ඇතුළට ඇවිදන් ගිය අතරේ, මම මං ඇඳන් හිටපු ඩෙනිම් කලිසමයි, ටී-ෂර්ට් එකයි දිහා බැලුවා. එයා ආපහු ආවේ සිපර් එකක් තියෙන පසුම්බියක් එක්ක.

"මාසෙට පන්සිය පනහයි. පළවෙනි මාසෙ කුලියයි, අන්තිම මාසෙ කුලියයි අදම ගෙවන්ඩ ඕනෙ."

මම අදාළ ගාණ ගණන් කරලා, එයාගේ අතෙන් තිව්වා. "බඳු ගිවිසුමක් නැද්ද?"

සල්ලි ටික පසුම්බියේ ඔබාගන්න ගමන්, එයා හිනාවුණා. "ඔයා ඉන්නෙ හයවෙනි නිවාසෙ," එයා ඇඟිල්ලක් උඩට දික්කරලා කිව්වා. "ඒ කියන්නෙ, හරියටම මට උඩින් තියෙන නිවාසෙ. ඒ හන්දා මහ ලොකුවට සද්ද බද්ද කරන්න තියාගන්න එපා. මම වේලපහ නිදාගන්නවා."

"තව මොනවද කුලියට අයිතිවෙන්නෙ?"

"වතුර ලැබෙනවා. තව, කුණු අයින් කරනවට ගෙවන ගාස්තුවත් ඔකට අයිතියි. හැබැයි, ඔයාට විදුලි බිල නම් ගෙවන්න වෙනවා. දැනට විදුලිය වැඩ. ඔයාගෙ නමට ඒක හරවගන්න දවස් තුනක් තියෙනවා. ලයිට් කම්පැනියට දෙසිය පනහක තැන්පතු ගාස්තුවක් ගෙවලා ඒක හරවගන්න."

*ඉලව්වයි! දවස් තුනකින් ඩොලර් දෙසිය පනහක් හොයන්න?* දැන් නම්, මේ තරම් ඉක්මනට මෙහාට එන්න මම ගත්ත තීරණය හරිද කියලා, මට හිතෙන්න පටන්අරන්. ඒත් මාව රැඳවුම් නිවාසෙන් නිදහස් කරපු වෙලාවේ, මට තිබුණේ තෝරාගැනීම් දෙකයි: එක්කො මම මගේ අතේ තිබුණ හැම සතයක්ම වියදම් කරලා, ඒ නගරෙම

www.musesbooks.com

Copyrighted Material



පණ ගැටගහගන්න උත්සාහ කරන්න ඕනේ. එහෙම නැත්නම්, ඒ සල්ලි ඔක්කොම වියදම් කරලා, සැතපුම් තුන්සීයක් දුර ගෙවාගෙන මෙහාට එන්න ඕනෙ.

ඒත් මං වැඩියෙන් කැමති මෙහාට. කාලයක් ස්කොට්ට සම්බන්ධ වෙලා හිටපු හැමකෙනෙක්ම ඉන්න මේ නගරෙට.

ගෙවල් අයිති ගෑනු කෙනා, එයාගේ නිවාසෙ ඇතුළට අඩියක් තිච්චා. "පැරඩයිස් නිවාස සංකීර්ණයට ඔයාව සාදරයෙන් පිළිගන්නවා. ඔයා ගිහින් බඩුමුට්ටු ටික අස්පස් කරගත්තාම, මම පූස් පැටියෙක්ව ගෙනත් දෙන්නම්."

මම පුළුවන් වේගෙන් දොරට අත තියලා, එයා ඒක වහන්න කලින් අල්ලගත්තා. "පොඩ්ඩක් ඉන්න. මොකක්ද ඔයා කිව්වෙ? පූස් පැටියෙක්?"

"ඔව්, පූස් පැටියෙක්. ඒ කියන්නෙ පූසෙක් වගේ, හැබැයි පොඩියි."

මම එයාගේ දොර ළඟින් අඩියක් පස්සට ගත්තේ, හරියට නිකන් එහෙම ඇත්වුණාම එයා කිව්ව කතාවෙන් මට ගැලවෙන්න පුළුවන් වෙයි වගේ.

"එපා, ස්තූතියි! මට පූස් පැටියෙක් ඕනෙ නෑ."

"මගේ ළඟ ඕනෙවටත් වඩා ඉන්නවා."

"මට පූස් පැටියෙක් ඕනෙ නෑ," මං ආයෙම සැරයක් කිව්වා.

"කාටද පූස් පැටියෙක්ව ඕනෙවෙන්නෙ නැත්තේ?"

"මට."

එයා නාහෙන් පිම්බේ, හරියට නිකන් මං මහ අසාධාරණ උත්තරයක් දුන්නු ගාණට. "මං ඔයා එක්ක මෙහෙම ගනුදෙනුවක් කරන්නම්," ගෑනු කෙනා කියන්න ගත්තා. "ඔයා පූස් පැටියෙක්ව ගන්නවා නම්, මම සති දෙකක් යනකල් මගේ ගාණෙ කරන්ට් එක දෙන්නම්!"

*මේ මොන ඉලව් ජාතියක තැනක්ද?*

"හොඳයි," එයා ආයෙම කිව්වේ, මගේ නිශ්ශබ්දතාවය කේවල් කරන උපායක් විදියට හිතාගෙන වෙන්නැති. "මාසයක්! ඔයා එකම එක පූස් පැටියෙක්ව ගන්නවා නම්, සම්පූර්ණ මාසයක්ම මගේ ගාණෙ කරන්ට් එක දෙන්නම්," එයා එහෙම කියාගෙන, ගේ ඇතුළට ගියා. හැබැයි මේ වතාවේ ගෙදර දොර එහෙමම ඇරලා දාලයි තිබුණේ.

MusesBooks ®

www.musesbooks.com

Copyrighted Material



මට ඕනැති පූස් පැටියෙක් නෑ. කීයටවත්, කවදාවත් මට පූස් පැටව් ඕනෙ නෑ. හැබැයි මෙහෙමයි... මේ මාසේ, ඩොලර් දෙසිය පනහක විදුලි ගාස්තු තැන්පතුවක් ගෙවන්න වෙන්නෙ නැත්නම්, එක පූසෙක් නෙවෙයි, දෙතුන් දෙනෙක් වුණත් ගත්තට පාඩුවක් නෑ.

ගෙවල් අයිතිකාරි ආයෙම මතුවුණේ කළු පාටයි, තැඹිලි පාටයි කලවම් වුණු ඇබින්දන් පූස් පැටියෙක් එක්ක. එයා ඌව මගේ අත් දෙකෙන් තිව්වා. "ඔන්න... ඔන්න... මගෙ නම රූත්. ඔයාට මොනවහරි ඕනෙ වුණොත් කතාකරන්න. හැබැයි, එහෙම මුකුත් ඕනෙ නොවී ඉන්න උත්සාහ කරනවා නම් වැඩිය හොඳයි!" එයා ආයෙම ගේ ඇතුළට ගිහින්, දොර වහගන්නයි හැදුවේ.

"පොඩ්ඩක් ඉන්න. ඔයාට පුළුවන්ද කාසි දාන ටෙලිෆෝන් එකක් හොයාගන්න පුළුවන් කොහෙන්ද කියලා මට කියන්න?"

රූත් කෙකර හිනාවක් පෑවා. "ඇයි බැරි... දෙදාස් පහ අවුරුද්දෙන් විතර වගේ හොයාගන්න පුළුවන් වෙයි මගෙ හිතේ!" ඒ වතාවෙ නම්, එයා සම්පූර්ණෙන්ම දොර වහගත්තා.

පූස් පැටියා කෑගහනවා. ඒත් මේ හරි හුරතල් මියෑව් සද්දයකින් නම් නෙවෙයි. ඒක හරියට උදව් ඉල්ලලා කෑගහනවා වගේ සද්දයක්. "ඔයාට විතරක් නෙවෙයි, මටත් උදව් ඕනේ පැටියෝ," මම මිමිනුවා.

මං මගේ සූට්කේස් එකයි, මගේ පූස් පැටියයි අරගෙන පඩිපෙළ දිහාට යන්න ගත්තා. බාගවිට ආපහු මෙහාට එන්න කලින්, මට අඩුම තරමේ මාස දෙක තුනක් හරි ඉවසගෙන ඉන්නයි තිබුණේ. මම වැඩ කරලා යන්තම් ඩොලර් දෙදහකට වැඩියෙන් ඉතුරු කරගත්තත්, ඒකෙන් වැඩිහරියක් මෙහාට එන ගමනටම වියදම් වෙලා ඉවරයි. මට තව වැඩිපුර සල්ලි ටිකක් ඉතුරු කරගන්නයි තිබුණෙ. බැරිවෙලා හරි, මට ඉක්මනින්ම රස්සාවක් හොයාගන්න බැරිවුණොත්? ඒ මදිවට දැන් මේ පූස් පැටියෙක් පණපිටින් තියාගන්න වගකීමකුත් මගෙ පිටට වැටිලනේ.

මගේ ජීවිතේ දැන්, ඊයෙ දවසට වඩා දහගුණයකින් අමාරු වෙලා.

ටී-ෂර්ට් එකේ එල්ලිලා හිටපු පූස් පැටියත් එක්ක, මම කොහොමහරි මගේ අපාර්ට්මන්ට් එක ළඟට ආවා. යතුර, ලොක් එක ඇතුළට දැම්මට, ඒක කරකවන්න මට අත් දෙකෙන්ම දොර ඇදලා අල්ලගන්න සිද්දවුණා. මම මගේ අලුත්ම ගෙදර දොර ඇතුළට

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



තල්ලු කරලා විවෘත කළේ, හුස්ම උඩට අල්ලගත්ත ගමන්මයි. ඒක ඇතුළෙන් මොනවගේ සුවඳක් ඒවිද කියලා මම බයෙන් හිටියේ.

ලයිට් දාලා වටපිට බලන ගමන්, මම හෙමින් හෙමින් හුස්ම පහතට දැම්මා. කියන්න තරම් මහ ලොකු ගඳක් ඇත්තෙත් නෑ. ඒක එක අතකින් හොඳයි, අනිත් අතින් නරකයි.

සාලෙ කවිච්චියක් තිබුණා. හරියටම කියනවා නම්, සාලෙටම තිබුණෙ ඒක විතරයි. පොඩි සාලයක්... ඊටත් වඩා පොඩි කුස්සියක්. කෑම කාමරයක්වත්, නිදන කාමරයක්වත් නෑ. හැබැයි ඇඳුම් අල්මාරියක් නම් තියෙනවා. මේක, මේ තියෙන ඉඩකඩ, අත්‍යාවශ්‍යම දේවලට විතරක් වෙන්කරලා හදපු ගෙයක්. අහ්, තව නාන කාමරයකුත් තියෙනවා. ඒත් ඒක කොයිතරම් පුංචිද කියනවා නම්, ටොයිලට් එක බාත්ටබ් එකේ ගෑවෙනවා.

මේක මහ වැදගැම්මකට නැති කුණුගොඩක්. වර්ග අඩි පන්සීයක දහජරා නරාවළක්. හැබැයි මට නම්, ඒක හිටපු තැනින් උඩට තියපු අඩියක්. මම හිටියේ, තව කෙනෙක් එක්ක වර්ග අඩි සීයක් බෙදාගන්න වුණු සිරමැදිරියක. එතැනින් පස්සෙ, සංක්‍රාන්ති නිවාසෙ කාමර සගයො හයදෙනෙක් එක්කත් මම ජීවත්වුණා. දැන් අන්තිමට, මට මගේම කියලා කියන්න පුළුවන් වර්ග අඩි පන්සීයක් තියෙනවා.

වයස අවුරුදු විසිහයක් වෙච්ච මම, ජීවිතේ පළවෙනි වතාවට, නිල වශයෙන් තනියම තැනක ජීවත්වෙන්නයි යන්නේ! ඒක බය හිතෙන කාරණාවක්. අනෙක්අතට, මහා නිදහසකුත් දැනෙන මොහොතක්.

මාසයක් ගතවුණාට පස්සේ, මට මෙතන කුලිය ගෙවාගන්න පුළුවන් වෙයිද කියලා මම දන්නෙ නෑ. ඒත් මම උත්සාහ කරලා බලනවා. ඒකේ තේරුම, දකින දකින හැම කඩසාප්පුවකටම ගිහින් රස්සාවක් ඉල්ලන්න වෙනවා කියන එක වුණත්, මම ඒක කරන්න ලෑස්තියි.

තමන්ගෙම කියලා අපාර්ට්මන්ට් එකක් තියෙන එක, ලැන්ඩ්‍රිලා එක්ක තියෙන නඩුවට මම අභියාචනාවක් ඉදිරිපත් කරද්දි වුණත්, මට වාසියක් වෙන්න පුළුවන්. මම දැන් ස්වාධීනයි කියලා ඒකෙන් පෙන්නාවි. ඒ ස්වාධීනත්වය, මහා අරගලයක් වුණත් මට කමක් නෑ.

පූස් පැටියට බිමට බහින්න ඕනෙ වෙලා. ඉතින් මම ඌව සාලෙ බිමින් තිව්වා. ඌ එහාට මෙහාට ඇවිද ඇවිද, පහළ තට්ටුවේ

www.musesbooks.com

Copyrighted Material



දාලා එන්න සිද්දවුණ කාටහරි අඬගහනවා. මහහයියෙන් කෑගග හා අඬගහනවා. ඌ හැම මුල්ලක්ම පීර පීර, එළියට යන්න තැනක් හොයනවා දැක්කාම මගේ පපුව හිරවෙන්න ගත්තා. ඌ ඔය හොයන්නෙ ආපහු ගෙදර යන්න පාරක්. තමන්ගේ අම්මයි, සහෝදර සහෝදරියොයි ළඟට යන්න පාරක්.

ඇගේ තැනින් තැන තියෙන කළු පාටයි තැඹිලි පාටයි නිසා, එයාගෙ පෙනුම හරියට නිකන් 'බම්බල්බී' වගේ. එහෙම නැත්නම් හැලෝවීන්වලට හදන සැරසිල්ලක් වගේ.

"අපි ඔයාට දාන නම මොකක්ද?"

එයාගෙ නම ගැන මම ටිකක් හිතලා බලන්න ඕනේ. ඒකේ තේරුම, දවස් කීපයක්ම එයාට නමක් නැතුව ඉන්න වෙන එක කියලා නම් මං හොඳටම දැනගෙන හිටියා. මොකද, මම *'දේවල්වලට නම් දානවා'* කියන කාරණයේ තියෙන වගකීම බොහොම බරපතළ විදියට ගන්න කෙනෙක්. කාටහරි නමක් දාන වගකීම මට අන්තිම වතාවට පැවරුණු වෙලාවෙ, මම ඊට කලින් කවදාවත් නැතිතරම් බරපතළ විදියට ඒ වගකීම බාරගත්තා. සමහරවිට ඒකට හේතුව, මම හිරකුටියට වෙලා ගතකරපු මුළු ගර්භණී කාලය පුරාම, මට කරන්න තිබුණ එකම දේ දරුවට නමක් තෝරන එක විතරක් නිසා වෙන්න ඇති.

මම තෝරාගත්ත නම 'ඩියම්'. මොකද මම දැනගෙන හිටියා, හිරෙන් නිදහස් වෙලා ආපහු මෙහාට ආව හැටියෙම, ඇයව හොයාගන්න පුළුවන් හැමදෙයක්ම මම කරනවා කියලා.

මෙන්න, මං ඇවිත් ඉන්නවා.

*කාපෙ ඩියම්.*

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# දෙවැනි පරිච්ඡේදය

## ලෙපජ්

මගේ දකුණු අතේ නියපොතුවල තාමත් නිය ආලේපන තියෙනවා කියලා මං දැක්කේ, බාර් එක පිටිපස්සේ තියෙන පටුපාරට ට්‍රක් එක දානකොට. මඟුල! මම ඊයේ රෑ අවුරුදු හතරක ළමයෙක් එක්ක අඳින-පලඳින සෙල්ලමක් කරා කියලා මට අමතකම වුණානෙ.

*කමක් නෑ, අඩුම තරමේ ඒ දම්පාට මගෙ වැඩට අඳින කමිසෙට හරි ගැළපෙනවනේ.*

මම ට්‍රක් එකෙන් බහිනකොට, රෝමන්, කුණු බෑග් ටික බක්කිවලට දානවා. මගෙ අතේ තියෙන තෑගි පාර්සලේ දැකලා, ඒක තමන්ට බව හොඳටම දන්න නිසා එයා ඒක ගන්න අත දික්කළා. "මං කියන්නද මේක මොකක්ද කියලා? කෝපි මග් එකක්නේ?" රෝමන්, පාර්සලේට එබෙන ගමන් කිව්වා.

*ඔව්, ඒක කෝපි මග් එකක් තමයි. හැමදාම ගේන්නෙ ඉතින් කෝපි මග් තමයි.*

මිනිහා මට ස්තුතියි කිව්වෙ නෑ. කවදාවත් කියන්නෙ නෑ.

මේ මග්වලින් සංකේතවත් කරන අමද්‍යප බව ගැන රෝමන්වත්, මමවත් වචනෙන් කතාකරන්නේ නැති වුණාට, මං හැම සිකුරාදම මිනිහට මග් එකක් ගේනවා. අද ගෙනාවේ මම එයාට තෑගි කරපු අනූ හයවෙනි මග් එක.

දැනටම එයාගෙ අපාර්ට්මන්ට් එක කෝපි මග්වලින් පිරිලා තියෙන හන්දා, හරිනම් මම මේ වැඩේ දැන් නවත්තන්න ඕනේ ඇති. ඒත් දැන් මම ඒක නවත්තගන්න බැරිතරම් දුරක් ඇවිල්ලා වගෙයි

MUSESBOOKS®

Copyrighted Material



මට දැනෙන්නේ. දැන් එයා අමද්‍යප විදියට ගතකරන සියවැනි සතියටත් ළංවෙලයි ඉන්නෙ. ඔය සියවැනි කඩයිම වෙනුවෙන් දෙන්න ඕනේ මග් එක මම මගේ ළඟ තියාගෙන ඉන්නේ දැන් සෑහෙන කාලෙක ඉඳලයි. ඒක ඩෙන්වර් බ්‍රොන්කොස් මග් එකක්. *රෝමන්ට පේන්නම බැරි කණ්ඩායම!*

රෝමන්, බාර් එකේ පිටිපස්සෙ දොර දිහාට අත දික්කරලා පෙන්නුවා. "ඇතුළේ ඉන්න ජෝඩුවක් අනික් කස්ටමර්ස්ලට වදදෙන්න පටන්අරන්. උඹට පොඩ්ඩක් ඒ පැත්තට ඇහැගහගෙන ඉන්න වෙයි."

ඒක නම් අමුතුයි. සාමාන්‍යයෙන් අපිට හවස්වරුවේ, මේ තරම් වේලාසනින් නාහෙට අහන්නෙ නැති අය එක්ක ගනුදෙනු කරන්න සිද්දවෙන්නෙ නැති තරම්. අඩුතරමේ වෙලාව තවම හයටවත් නෑ. "ඔය කියන ජෝඩුව කොහෙද වාඩිවෙලා ඉන්නෙ?"

"ජූක්බොක්ස් එක ළඟ," එයාගේ ඇස් මගේ ඇඟිලි දිහාට හැරුණා. "ලස්සන නියපොතු ටික, කොල්ලො!"

"නියමයි නේද?" මම අත උස්සලා, ඇඟිලි හොලවනගමන් කිව්වා. "අවුරුදු හතරක පොඩි කෙල්ලෙක් විදියට ගත්තම, එයා නියමෙට වැඩේ කරලා තියෙනවා."

බාර් එකේ පිටිපස්සෙ දොර අරිනකොටම මට ඇහුණේ, 'අග්ලි කිඩ් ජෝ' සංගීත කණ්ඩායම මං ආසම සින්දුව අනුහව කරන හැටි. ඒ මදිවට ලවුඩ්ස්පීකර්වලින්!

*මේකට නම් කොහෙත්ම ඉඩදෙන්න බෑ!*

කුස්සිය පහුකරගෙන බාර් එකට ගිය මම, වැඩි වෙලාවක් යන්න කලින් ඒ දෙන්නව දැක්කා. ජෝඩුව ඉන්නෙ හරියට ජූක්බොක්ස් එක උඩ නැගලා වගේ, ඒකට නැමීගෙන. මම සද්ද නැතුව එයාලා ළඟට ගියාමයි දැක්කේ, ජෝඩුවේ ගෑනු මනුස්සයා එකම අංක හතරට ආයෙ ආයෙ අතින් ගහනවා. හොර වැඩක් කරපු පොඩි එවුන් වගේ ඒ දෙන්නා හිනාවෙන අතරේ, මම එයාලගේ උරහිස්වලට උඩින් බරවෙලා, තිරය දිහා බැලුවා. 'කැට්ස් ඉන් ද ක්‍රැඩල්' සිංදුව එක දිගට තිස්හය වතාවක් වාදනය වෙන්න දාලා!

මම උගුර පෑදුවා. "ඔහේලා හිතන්නෙ මේක හරි හිනායන වැඩක් කියලද? මට එකම සිංදුව පැය හයක් තිස්සෙ අහන්න සලස්සන එක?"

MusesBooks®

Copyrighted Material



මගේ කටහඬ ඇහුණු ගමන්, මගේ තාත්තා වේගෙන් පිටිපස්සට හැරුණා. **"ලෙජර්!"** මාව ඇදලා අරන් බදාගන්න ගමන් එයා කෑගැහුවා. තාත්තා ළඟින් බියරුයි, මෝටර් ඔයිලුයි කලවම් සුවඳක් එනවා. අහ්, තව දෙහි සුවඳකුත් එනවද කොහෙද!

*මේ ජෝඩුවට වෙරිද?*

මගේ අම්මා ජූක්බොක්ස් එක ළඟින් අහකට වුණා. "අපි මේ ඒක හරිගස්සන්නයි හැදුවේ, අපි කරපු දෙයක් නෙවෙයි මේ!"

"අපොයි ඔව්, අපොයි ඔව්. ඔයාලා නෙවෙයි නේන්නම්!" මම අම්මව වැළඳගන්න ගමන්ම කිව්වා.

කවදාවත් එයාලා කලින් දැනුම්දීලා නම් එන්නෙ නැහැ. එකපාරටම මතුවෙනවා. ඉන්පස්සෙ දවසක් දෙකක් ඉඳලා, ආයෙම එයාගේ ආර්.වී.[1] එකේ නැගලා යන්න යනවා. ඔන්න ඔහොමයි හැමදාම සිද්දවෙන්නෙ.

ඒත් මේ විදියට වෙරිමරගාතෙ කඩාපාත් වෙන එක නම්, කලින් සිද්දවෙලා නැති අලුත් දෙයක්. මම උරහිසට උඩින් හැරිලා බැලුවා. රෝමන්, බාර් එකේ පිටිපස්සෙ ඉන්නවා. මම එයාට මගේ අම්මවයි, තාත්තවයි පෙන්නලා ඇහුවා, "මේක උඹ කරපු දෙයක්ද? නැත්නම්, එයාලා ආවෙම මේ විදියටද?" කියලා.

රෝමන් උරහිස් හැකිළුවා. "දෙකෙන්ම ටික ටික!"

"අද අපේ ඇනිවසරි එක," අම්මා කිව්වා. "ඉතින් අපි සමරනවා."

"ඔය දෙන්නා තනියම ඩ්‍රයිව් කරගෙන මෙහාට ආවේ නැතුව ඇති කියලා මම හිතනවා?"

"නෑ, අපි ඩ්‍රයිව් කළේ නෑ. අපේ කාර් එකයි, ආර්.වී එකයි දෙකම සර්විස් කරන තැන. ඉතින් අපි කෙනෙකුට කියලා මෙහාට ඇරලවගත්තා," තාත්තා කිව්වෙ මගේ කම්මුලකට තට්ටුවක් දාන ගමන්.

"අපිට ඔයාව දකින්නයි ඕනෙ වුණේ. ඒත් අපි පැය දෙකක් තිස්සෙ ඔයා එනකල් මෙතන බලාගෙන ඉන්නවා. දැන් නම් අපි යන්නයි හදන්නෙ. මොකද, අපි දෙන්නටම බඩගිනියි."

"ඔන්න ඕක නිසා තමයි, ඔයාලා ටවුන් එකට එනවා නම් මට පොඩ්ඩක් කලින් කියලා තියන්න ඕනෙ. මටත් කියලා ඉතින් ජීවිතයක් තියෙනවනේ!"

"ඔයාට අපේ ඇනිවසරි එක මතක් වුණාද?"

1 *RV*

MUSESBOOKS®

www.musesbooks.com

Copyrighted Material



"මට ඒක මතක් වුණේ නෑ. සමාවෙන්න ඕනෙ."

"මම ඔයාට කිව්වනේ!" තාත්තා, අම්මා දිහාට හැරිලා කිව්වා. "මගේ සල්ලි දෙන්න, රොබින්."

අම්මා එයාගෙ සාක්කුවට අත දාලා, ඩොලර් දහයෙ නෝට්ටුවක් අරන් තාත්තගේ අතෙන් තිව්වා.

එයාලා හැමදෙයක් ගැනම ඔට්ටු අල්ලනවා. *මගේ ආදර ජීවිතේ, එතකොට, මට මතක හිටින නිවාඩු දවස. කොටින්ම, මම සෙල්ලම් කරන ෆුට්බෝල් ගේම් එක ගැන පවා.* හැබැයි මේ දෙන්නා අතේ අවුරුදු ගාණක් තිස්සේ දෙපැත්තට මාරු වෙවී තියෙන්නෙ, එකම ඩොලර් දහයේ නෝට්ටුව කියලා නම්, මට හොඳටම විශ්වාසයි.

තාත්තා එයාගෙ හිස් වීදුරුව අතට අරගෙන, ඒක හෙලෙව්වා. "අපිට තව බොන්න ගේන්න, බාර්-ටෙන්ඩර්!"

මම එයාගේ වීදුරුව අතට ගත්තා. "අයිස් වතුර ටිකක් බිව්වොත් මොකද?" මම එයාලට ජූක්බොක්ස් එක ළඟ ඉන්න ඇරලා, ආපහු බාර් එක පිටිපස්සට ආවා.

අතරමංවෙලා වගේ පෙනුමක් තියෙන ගෑනු ළමයෙක් බාර් එක ඇතුළට ගොඩවැදුණේ, මං වතුර වීදුරු දෙකක් පුරව පුරව ඉන්න වෙලාවේ. එයා බාර් එක පුරාම ඇස් කැරකෙව්වේ මීට කලින් කවදාවත් මෙතැනට ඇවිල්ලා නැති කෙනෙක් වගේ. බාර් එකේ අනිත් කෙළවරේ, කවුරුවත් නැති හිස් මුල්ලක් තියෙනවා දැකපු ගමන් එයා කෙළින්ම එතනට ගියා.

ඒ ගෑනු ළමයා බාර් එක මැද්දෙන් ඇවිදගෙන යන මුළු වෙලාවෙම, මම එයා දිහාමයි බලාගෙන හිටියේ. මං කොයිතරම් ඇලිලා ගැලිලා එයා දිහා බලාගෙන හිටියද කියනවා නම්, වීදුරු දෙක පිරිලා ඉතිරිලා වතුර අහක යනකල්ම මම එයා දිහා බලාගෙන ඉඳලා තිබුණා. තුවායක් අරගෙන වතුර හැලුණු තැන පිහදාලා, මං අම්මා දිහා බැලුවා. එවෙලේ අම්මා ඒ ගෑනු ළමයා දිහා බලාගෙනයි හිටියේ. ඊටපස්සෙ මගේ දිහා බැලුව එයා, ආයෙමත් ගෑනු ළමයා දිහා බැලුවා.

*ඉවරයි!* දැන් අම්මා මට, මෙතැනට ආව කස්ටමර් කෙනෙක්ව ජෝඩු කරන්න යන එක තමයි, මට එයාගෙන් වෙන්න ඕනෙ අන්තිම දේ! එයා සිහියෙන් ඉන්න වෙලාවට කරන්නෙත් මට මඟුල් කපුකම් කරන එකම වෙච්චකොට, දැන් එයා වෙරිමරගාතෙ ඉන්නකොට ඒක කොයිතරම් නරක අතට හැරෙයිද කියලා මට හිතාගන්නවත්

www.musesbooks.com

Copyrighted Material



බෑ. දැන්, මම මේ දෙන්නව පුළුවන් ඉක්මනින් මෙතැනින් යවාගන්න ඕනේ.

එයාලගෙ වතුර වීදුරු දෙකත් ගිහින් දීලා, මම අම්මට මගේ ක්‍රෙඩිට් කාඩ් එක දුන්නා.

"ඔය දෙන්නා ජේක්ගෙ ස්ටීක් හවුස් එකට ගිහින්, හොඳ ඩිනර් එකක් ගන්න ඕනෙ. ඒක මගේ ගාණෙ ඔන්න! මං හිතන්නෙ ඔයාලා පයින්ම යන එකයි හොඳ, එතකොට ටිකක් වෙරි බහීවිනෙ!"

"ඔයා නම් හරිම හොඳයි!" අම්මා නාට්‍යයක රඟපානවා වගේ හරිම විකාර විදියට පපුවට අතත් තියාගෙන, තාත්තා දිහා බලලා කිව්වා. "බෙන්ජි, අපි එයාව හරිම හොඳට හදලා තියෙනවා. එන්න, යමු. අපි ගිහින් අපේ විශිෂ්ට දෙමාපිය කාර්යභාරය එයාගෙ ක්‍රෙඩිට් කාඩ් එකෙන් සමරමු."

"අපි එයාව බොහොම අපූරුවට හදලා තියෙනවා නේන්නම්!" තාත්තත් ඒ කතාවට නම් එකඟ වුණා. "අපිට තිබුණේ තව ළමයි දෙතුන් දෙනෙක් හදන්න."

"ආර්තවහරණය කියන්නෙ සෙල්ලමක් නෙවෙයි, වස්තුවේ! ඔයාට මතකනේ, මම මුළු අවුරුද්දක්ම ඔයාව දැහට පේන්න බැරුව ඉඳපු හැටි?" අම්මා එයාගෙ පර්ස් එක අතට අරගෙන යන්න ගියා. ඒ යන ගමන් වතුර වීදුරු දෙකත් ගෙනියන්න ඒ දෙන්නා අමතක කළේ නෑ.

"සල්ලි ගෙවන්නෙ එයා හන්දා, මම නම් කියන්නෙ අපි රිබ් අයි[2] ගත්තා නම් හරි!" යනගමන් තාත්තා මුමුනනවා මට ඇහුණා.

සැනසුම් සුසුමක් නිදහස් කරලා, මම ආපහු බාර් එක දිහාට ආවා. ගෑනු ළමයා, සද්දබද්ද නැතුව මුල්ලට ගුළිවෙලා, සටහන් පොතක මොනවදෝ කුරුටුගානවා. රෝමන් මේ වෙලාවේ බාර් එක පිටිපස්සෙ නෑ. ඒ හන්දා තවම කවුරුවත් එයාගේ ඇනවුම ගත්තෙ නැතුව ඇති කියලා මම අනුමාන කළා.

ඉතින් මං බොහොම සන්තෝෂෙන් ඒ වැඩේට ඉදිරිපත් වුණා.

"මම ඔයාට මොනවද ගේන්න ඕනෙ?" මම එයාගෙන් ඇහුවා.

"කරුණාකරලා මට වතුරයි, ඩයට් කෝක් එකකුයි දෙන්න," එයා මගේ දිහා බලන්න ඔළුව උස්සන්නෙවත් නැතුව කිව්වා. ඉතින් මම එයාගෙ ඇනවුම අරගෙන එන්න හිතාගෙන එතැනින් ආවා. මම එයාගෙ ඇනවුමත් අරගෙන ආපහු යනකොටත්, එයා හිටියේ

2 *Rib eye* - කොඳුනාරටිය පෙදෙසින් ලබාගන්නා, කටු රහිත මාංශමය කොටස

www.musesbooks.com

Copyrighted Material



අර සටහන් පොත කුරුටුගාන ගමන්මයි. මේ කෙල්ල මොනවද මේ හැටි ලියන්නෙ කියලා බලාගන්න මම උත්සාහ කළත්, එයා එකපාරටම පොත වහලා දාලා, ඔළුව ඉස්සුවා. "ස්තුතියි..." එයා කියන්න ගිය දේ මැදින් නැවැත්තුවා. මං හිතන්නෙ, ඒ ගෑනු ළමයා කියන්න උත්සාහ කළේ, 'ස්තුතියි ඔයාට' කියලා වෙන්න ඕනෙ. ඔයාට කියන වචනෙ යන්තම් කනට නෑහෙන ගාණට මුමුනලා, එයා බීම බටේ කටේ ගහගත්තා.

*එයා ඉන්නෙ මොනවහරි දේකට හිත කැලඹිලා වගේ!*

මට එයාගෙන් එයාගෙ නම, කොහේ ඉඳන්ද ආවේ වගේ ප්‍රශ්න අහන්න ඕනකමක් තිබුණා තමයි. හැබැයි අවුරුදු ගාණක් තිස්සේ මේ තැන අයිතිකාරයා විදියට ඉඳලා මම ඉගෙනගත්ත දෙයක් තියෙනවා. ඒ තමයි, බාර් එකක තනිපංගලමේ ඉන්න මිනිස්සුන්ගෙන් ප්‍රශ්න අහන එක නොකළ යුතු දෙයක් බව. මොකද, ඒ විදියට පටන්ගන්න කතා, බොහොම වේගෙන් මට අතින් පයින් කතාකරලා ඉවර කරන්න සිද්දවෙන තැනට දුරදිග යන්න පුළුවන් නිසා!

ඒත් මෙතැනට එන හුඟක් මිනිස්සු, මේ කෙල්ල වගේ මගේ අවධානය පැහැරගන්නෙ නෑ. මම එයාගේ බීම වීදුරු දෙක දිහාට ඉඟිකරලා, කතාවට මුලපිරුවා. "ඔයා තව කවුරුහරි එනකල්ද බලන් ඉන්නෙ?"

ඇය වීදුරු දෙකම තමන්ගෙ දිහාවට ඇදලා ළං කරගත්තා. "නෑ, මට තිබහයි. ඒකයි."

එහෙමම මගේ දිහාට හැරිලා තිබුණ ඇස් දෙක අහකට හරවපු එයා, හරිබරිගැහිලා පුටුවට හේත්තු වුණා. ඊටපස්සේ අතේ තිබුණු සටහන් පොතට තමන්ගේ සම්පූර්ණ අවධානයම දුන්නා.

ඒ ඉඟියෙන් කිව්වෙ මොකක්ද කියලා මට තේරුම්ගන්න බැරි නෑ. ඉතින් මං එයාට එයාගෙ පාඩුවේ ඉන්න ඇරලා, බාර් එකේ අනෙක් කෙළවරට ගියා.

කුස්සියේ ඉඳන් එළියට ආපු රෝමන්, ඔළුවෙන් අර ගෑනු ළමයා හිටපු පැත්ත පෙන්නුවා. "කවුද ඒ කෙල්ල?"

"මං දන්නෙ නෑ. හැබැයි එයාගෙ අතේ මඟුල් මුද්දක් නම් නෑ. ඒ කියන්නෙ, ඒකි උඹ කැමති ජාතියෙ නම් නෙවෙයි!"

"නියම විහිළුව!"

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# තෙවැනි පරිච්ඡේදය

## කෙනා

ආදරණීය ස්කොටී,

එයාලා පරණ පොත් කඩේ වහලා, එතැන බාර් එකක් දාලා. ඇත්තටම ඔයාට ඒ විකාර වැඩේ අදහගන්නවත් පුළුවන්ද?

අපි ඉස්සර හැම ඉරිදාම වාඩිවෙලා ඉන්න පුරුදුවෙලා හිටිය සෝෆාවට එයාලා මොනවා කරන්න ඇතිද කියලයි මම මේ කල්පනා කරන්නෙ.

හැබැයි මට මෙන්න මේක නම් සහතික කරලම කියන්න පුළුවන්. ඔයා මැරුණට පස්සේ, මෙහෙ හැමදේම උඩුයටිකුරු වෙලා. හරියට නිකන් ඉස්සර, මහවිසාල මොනොපොලි බෝඩ් එකක් විදියට තිබුණ මේ මුළු ටවුමම, ඔයාගෙ මරණෙන් පස්සෙ කවුරුහරි ඇවිත් උස්සලා, අනික් පැත්ත හරවලා, කෑලි සීසීකඩ විසුරුවා දාලා වගේ.

කිසිම දෙයක් ඉස්සර වගේ නෑ. හැමදෙයක්ම දැනෙන්නෙ මහ නුපුරුදු දේවල් විදියට. මම පහුගිය පැය ගාණම කළේ, කඩවීදි දිගේ ඇවිද ඇවිද, හැමදෙයක්ම ආයෙමත් අත්විඳින්න උත්සාහ කරන එකයි. ඔයා දන්නවද, සිල්ලර බඩු කඩේට යන්න කියලා හිතාගෙන ගෙදරින් පිටවෙලා ආව මගේ සිහිකල්පනාව එහෙමපිටින්ම වෙන පාරකට ඇදලා දැම්මේ මොකක්ද කියලා? අපි දෙන්නා අයිස්ක්‍රීම් කකා, වාඩිවෙලා ඉන්න පුරුදුවෙලා හිටිය බංකුව! මම එතැන ටිකක් වෙලා ඉඳගෙන, මිනිස්සු එහෙ මෙහෙ යන හැටි බලා හිටියා.

www.musesbooks.com

Copyrighted Material



මේ ටවුමේ මිනිස්සු හරිම සැහැල්ලුවෙන් ඉන්න පාටයි. එයාලා එහෙ මෙහෙ යන්නෙ හරියට, එයාලගෙ ලෝකේ හරි පැත්ත උඩට තියෙන විදියටම පිහිටලා තියෙනවා වගේ! පේමන්ට් එකෙන් ඇදගෙන වැටිලා, ආකාසෙ පස්ස ඇනෙන එකක් නෑ වගේ! එයාලා එක මොහොතකින් තව මොහොතකට ඔහේ මාරුවෙලා යනවා. තමන්ගේ දුවලා අහිමිවුණු අම්මලා, තමන් ඉන්න ඉසව්වෙම ඇවිද ඇවිද ඉන්න බව එයාලට හාංකවිසියක අදහසක්වත් නෑ!

මං දන්නවා, මම මේ බාර් එකක ඉන්න එක ඒ හැටි හොඳ අදහසක් නෙවෙයි වෙන්න ඇති. විශේෂයෙන්ම, මේක මං මෙහාට ආපහු ඇවිල්ලා ගෙවෙන පළවෙනි රෑ වෙච්චකොට. මට ඇල්කොහොල් එක්ක ප්‍රශ්නයක් තියෙනවා කියලා නෙවෙයි මං කියන්නෙ. ඔව්, ඔව්, මම දන්නවා, ඒ මහ භයානක රෑ ගැන කතාව නම් ටිකක් වෙනස් විත්තිය. ඒත් කොහොමහරි මම මෙහාට ආව ගමන්, ඔයාගේ අම්මා තාත්තා දෙන්නා බලන්න යන්නත් කලින්, මම බාර් එකකට ගොඩවුණා කියලා එයාලට ආරංචි වෙනවට නම් මම පොඩ්ඩක්වත් කැමති නෑ.

ඒත් ස්කොට්, මම හිතුවේ ඉතින් මෙතැන පොත් සාප්පුවක් තියෙනවා කියලනේ. පොත් සාප්පුවල සාමාන්‍යයෙන් කෝපි තියෙනවා. ඒක ඇතුළට ගියාම මට දැනුණේ මගේ බලාපොරොත්තු ඔක්කොම සුන්නද්දූලි වෙලා ගියා වගේ හැඟීමක්. ටික දුරක් බස් එකකයි, ඉතුරු ටික කැබ් එකකයි ගමනටම දියවෙලා ගිය මහා දිග දවසකට පස්සේ, මට හොඳ කැෆේන් මාත්‍රාවක් ඕනෙ වුණා. ඔව්, ඩයට් කෝක් එකක තියෙනවට වඩා ප්‍රබල කැෆේන් මාත්‍රාවක්!

සමහරවිට මේ බාර් එකේ කෝපි ඇති. මම තවම අහලා බැලුවේ නෑ.

හරිනම්, මම මේ කතාව ඔයාට නොකියා ඉන්න ඕනේ. හැබැයි මේ ලියුම ඉවරවෙන්න ඉස්සෙල්ලා, මම මේ කියන්න යන දේ තේරුමක් තියෙන දෙයක් බව ඔයාට හිතෙයි කියලා මම පොරොන්දු වෙනවා. මම හිරේ ඉද්දි, එකපාරක් මුරකාරයෙක්ව කිස් කළා!

ඇත්තම කියනවා නම්, අපිව අහුවෙලා, ඒ මුරකාරයව වෙන ඒකකයකට මාරුකරලත් යැව්වා. අපේ හාදුව නිසා එයා

www.musesbooks.com

Copyrighted Material



කරදරේ වැටුණු එක ගැන නම් මට වරදකාරී හැඟීමක් දැනුණා. ඒත් එයා විතරයි මට අංකයක් විදියට නැතුව, මනුස්සයෙකුට වගේ කතා කළේ. මට එයා ගැන කිසිම කැමැත්තක් ඇතිවෙලා තිබ්බෙ නැති වුණත්, එයා නම් මට කැමැත්තෙන් ඉන්න බව මං දැනගෙන හිටියා. ඉතින් අන්න ඒ නිසයි, එයා මාව බදාගෙන කිස්කරපු වෙලාවේ මමත් ආපස්සට එයාව කිස් කළේ. ඒ, මම එයාට 'ස්තූතියි' කියපු විදිය. මං හිතන්නෙ එයත් ඒක දැනගෙන හිටියා. එයාට ඒක ප්‍රශ්නයක් වුණේ නෑ. ඔයා මාව අන්තිම පාරට ස්පර්ශ කරලා, ඒ වෙනකොට අවුරුදු දෙකක්ම ගෙවිලා ගිහින් තිබුණා. ඉතින් එයා මාව බිත්තියට තද කරලා මගේ ඉණෙන් අල්ලගත්තාම, මම හිතුවා මට වැඩිපුර ඒ ස්පර්ශය දැනේවි කියලා.

ඒත් එහෙම දැනුණේ නැති එක ගැන නම් මට දුක හිතුණා.

මම ඔයාට මේක කියන්නෙ, එයාගෙන් මට කෝපි රස වගේ රසක් දැනුණු හන්දා. මං කියන්නෙ මේ, එයාලා හිරකාරයන්ට දෙන කෝපිවලට වඩා හොඳ ජාතියේ කෝපි ගැන. එයා හරියට නිකන්, කැරමලුයි, විප්ඩ් ක්‍රීමුයි එක්ක උඩින් චෙරි ගෙඩියකුත් තියලා දෙන, ස්ටාර්බක්ස් එකේ ඩොලර් අටක කෝපි එකක් වගේ රසයි. ඒකයි මම එයාව දිගටම කිස් කළේ. එහෙම නැතුව, මම ඒ හාදුවවත්, එයාවවත්, මගේ ඉණ වටේ එතිලා තිබුණ එයාගෙ අතවත් රසවිඳපු හන්දා නෙවෙයි. මට මගේ, මිලෙන් වැඩි, රස කරපු කෝපි එක මිස්වෙන නිසා.

ඒ වගේම, ඔයා නැති අඩුව දැනෙන නිසා. මට, මිලෙන් වැඩි කෝපියි, ඔයාවයි හුඟක් මතක්වෙනවා.

ආදරෙන්,

කෙනා.

* * * *

"ඔයාට තව වීදුරුවක් පුරවලා ඕනෙද?" බාර්-ටෙන්ඩර් අහනවා. එයාගෙ අත දිගටම ටැටූ තිබුණා. හරියටම කියනවා නම්, ඇඳගෙන හිටපු කමිසෙ අත ඇතුළෙ උඩටම යනකල් වගේ. බාර් ටෙන්ඩර් ඇඳගෙන ඉන්නේ දම්පාට කමිසයක්. දම්පාට කියන්නේ හිර ගේ ඇතුළෙදි නිතර දකින්න ලැබෙන පාටක් නෙවෙයි.

MusesBooks®

Copyrighted Material



ඇත්තටම හිර ගේ කියන්නෙ කිසිම කලඑළියක් නැති, පාටක් නැති තැනක්. මට ඔය ගැන එහේ ඉන්න කාලේ කවදාවත් හිතුණෙ නෑ නම් තමයි. ඒත් ඒක ඇතුළෙ ටිකක් කල් ඉඳිද්දි, ගිම්හාන කාලෙට ගස් මොනපාටද කියලා ඔයාට අමතක වෙනවා.

"ඔයාලා ළඟ කෝපි තියෙනවද?" මම ඇහුවා.

"නැතුව! ඔයාට ඕනෙ ක්‍රීම් සහ සීනි එක්කද?"

"කැරමල් තියෙනවද? තව එතකොට, විප්ඩ් ක්‍රීම් ටිකකුත්?"

එයා රෙදි කෑල්ලක් තමන්ගෙ උරහිස උඩට වීසිකළා. "ආයෙත් අහලා! සෝයා කිරි, යොදය ඉවත් කරපු කිරි, ආමන්ඩ් කිරි, නැත්නම් යොදය සහිත කිරි?"

"යොදය සහිත කිරි."

බාර්-ටෙන්ඩර් හිනාවුණා. "මම ඔයාට විහිළුවක් කළේ. මේක බාර් එකක්. මගෙ ළඟ තියෙන්නෙ පැය හතරක් තිස්සෙ පැහෙන, පරණ කෝපි පෝච්චියක් විතරයි. ඔයාට කැමති නම් ක්‍රීම් සහ සීනි දෙකම හරි, එකක්වත් නැතුව හරි ගන්න පුළුවන්."

බාර්-ටෙන්ඩර්ගේ කමිසේ පාට, එයාගෙ හමේ පාටට කොයිතරම් අපූරුවට ගැළපෙනවද කියන කාරණාව මට නම් තවත් මහා ලොකුවට හිත ඇදිලා යන දේවල් නෙවෙයි. *පාහරයා.* "මට ඔය තියෙන මොනවහරි දෙන්න," මම යන්තම් මිමිනුවා.

බාර්-ටෙන්ඩර්, මගේ 'මූලික බන්ධනාගාර කෝපි' එක අරන් එන්න ගියා. එයා කෝපි පෝච්චිය ඒකේ අඬුවෙන් උස්සලා, නහය ළඟට අරන් සුවඳ බැලුවා. ඉන්පස්සෙ මූණත් ඇඹුල් කරගෙන, ඒකේ තිබුණ ඔක්කෝම සින්ක් එකට හලලා දැම්මා. පෝච්චියට අලුතින්ම වතුර පුරවලා, ලිප පත්තු කළා. ඒ අලුත් කෝපි පෝච්චිය උණුවෙන අතරෙම එයා, කවුදෝ කෙනෙක්ගේ බිලත් හදලා, යන්තමට හිනාවෙන හැටි මම බලාගෙනයි හිටියේ. යන්තමට කිව්වේ, ඕනෙවට වඩා වැඩිය නැතුව - ඇති කියලා හිතෙන තරමට.

ඒ තරම් සුමට විදියට, ගලා යන විදියට වැඩ කරන්න පුළුවන් කිසිම කෙනෙක්ව මම මීට කලින් දැකලා නෑ. හරියට නිකන් මිනිහට අත් හතකුයි, මොළ තුනකුයි තිබිලා, ඒ ඔක්කොම එකම වෙලාවේ වැඩ කරනකොට වගේ. තමන් කරන දේ හොඳටම කරන්න පුළුවන් කෙනෙක් දිහා බලන් ඉන්නකොට, වශී වෙනවා!

මට හොඳට කරන්න පුළුවන් දේවල් මොනවද කියලා මම දන්නෙ නෑ. කිසිම මහන්සියක් නැතුව වගේ, ස්වභාවික විදියට

www.musesbooks.com

Copyrighted Material



මට කරන්න පුළුවන් එකම එක දෙයක්වත් මේ ලෝකේ තියෙනවද කියලා මම හැබෑටම දන්නෙ නෑ.

මට හොඳට කරන්න වුවමනා දේවල් නම් තියෙනවා. මට හොඳ අම්මා කෙනෙක් වෙන්න ඕනෙ. මට අනාගතයේදි ලැබෙන දරුවන්ට වගේම, විශේෂයෙන්ම මම මේ ලෝකෙට දැනටමත් අරන් ආව දුවට. මට එක එක දේවල් වවන්න පුළුවන් වත්තක් ඕනෙ. ඒකෙ මං වවන්න හිතන් ඉන්නෙ හොඳට ප්‍රාණවත්ව, සරුසාරෙට හැදෙන, හැබැයි මැරිලා යන්නෙ නැති ජාති විතරයි. තව දෙයක් තමයි, 'මගේ කටින් එළියට පනින හැම වචනයක්ම ආපහු ඇදලා ගන්න පුළුවන් නම්', කියලා හිත හිත වද වෙන්නෙ නැතුව, මිනිස්සු එක්ක කතාකරන්න ඉගෙනගන්න ඕනේ. පිරිමියෙක් මගේ ඉණෙන් ඇල්ලුවම, මට ඒ සංවේදනය හොඳට විඳින්න පුළුවන් වෙන්න ඕනෙ. මට ජීවිතේට හොඳට මූණදෙන්න ඕනෙ. මේ දේවල් කිසිම ආයාසයක් නැතුව කරනවා වගේ පිටතට පේන්නයි මට වුවමනා. හැබැයි මේ වෙනකල් මම කරලා තියෙන්නෙ, මගේ ජීවිතේ හැමදෙයක්ම හසුරවගන්න බැරි තරමට අමාරු කරගන්න එක විතරයි.

කෝපි එක ලැස්ති වුණාම බාර්-ටෙන්ඩර් ආයෙමත් මගෙ දිහාවට ආවා. එයා මග් එකකට කෝපි පුරවන අතරේ, මම එයා දිහා බැලුවා. මේ සැරේ නම් මම, මට පේන්න තිබුණ දේවල් හොඳට මනසට උරාගන්න ගමනුයි හිටියේ. තමන්ගේ දුවගේ භාරකාරීත්වය ගන්න උත්සාහ කරන තරුණ ගෑනු කෙනෙක්ට 'මෙයාගෙන් ඈත්වෙන තරමට ඇඟටගුණයි' කියලා හිතෙන තරමට, ඔහු කඩවසම්. එයාට තිබුණෙ, 'යමක් කමක් දැකලා තියෙන වග' පේන ඇස් දෙකක්. එකෙක්ට දෙන්නෙක්ට ගහලා තියෙන ජාතියේ අත් දෙකක්.

එයාගෙ වැඩ වගේම එයාගෙ කොණ්ඩෙත් හරිම වේගවත්. ඒ ඇස් ඉස්සරහට වැටිලා තියෙන දිග, අඳුරු කෙස් කැරැලි එයා හැරෙන හැරෙන දිහාවට හැරෙනවා. එයා කොණ්ඩෙ අල්ලන්නෙ නෑ. මම මෙතැන වාඩිවෙලා හිටපු මුළු කාලය පුරාවටම, එකම එකපාරක්වත් එයා කොණ්ඩෙ ඇල්ලුවේ නෑ. තමන්ගේ වැඩවලට හිතුවක්කාර විදියට බාධා කරන්න ඒ කොණ්ඩෙට ඉඩ දීලා, එයා තමන්ගෙ පාඩුවේ ඉන්නවා. හැබැයි ඊටපස්සේ එයා සැරින්සැරේ ඔළුව ගස්සලා, කොණ්ඩෙ තියෙන්න ඕනෙ තැනට යවනවා. එයා ඒ විදියට පුංචිම

Copyrighted Material



පුංචි චලනයක් කළාම, ඒ කොණ්ඩෙ එයාට ඕනෙ තැනට ගිහින් රැඳෙනවා. ඒක ගනකම, හරි අපූරු කොණ්ඩයක්! මගේ අත් ඒ කෙස් කැරැලි අතරින් යවන්න ඕනවෙන ජාතියේ කොණ්ඩයක්!

මගේ මග් එකේ දැන් කෝපි පිරිලා. ඒත් එයා එකපාරටම ඇඟිල්ලක් උස්සලා මට කතාකළා.

"තත්පරයක් ඉන්න."

එයා එහෙමම කැරකිලා, මිනිෆ්‍රිජ් එකක් ඇරලා, ඒකෙන් යොදය සහිත කිරි එකක් එළියට ගත්තා. ඒකෙන් ටිකක් මග් එකට දාලා, කිරි එක ආපහු ෆ්‍රිජ් එකට දාලා වැහුවා. ඊටපස්සෙ තව ෆ්‍රිජ් එකකින් - *සප්‍රයිස්!* විප්ඩ් ක්‍රීම් එකක් එළියට ගත්තා. ඊළඟට එයා අත පිටිපස්සට කරලා, ආයෙම ඉස්සරහට ගන්නකොට ඒ අතේ තිබ්බේ එකම එක චෙරි ගෙඩියක්. එයා බොහොම පරිස්සමට චෙරි ගෙඩිය මගේ කෝපි එකේ උඩින්ම රැඳෙව්වා. ඊටපස්සෙ කෝපි එක මේසෙ දිගේ මගේ දිහාට තල්ලු කරලා, අත් දෙක විහිදවගෙන බලන් හිටියෙ, හරියට එයා මේ දැන් මැජික් එකක් කළා වගේ.

"කැරමල් නම් නෑ," එයා කිව්වා. "හැබැයි, කෝපි කඩයක් නොවෙන තැනක මට කරන්න පුළුවන් උපරිමය!"

හැමදාම ඩොලර් අටේ කෝපි බොන්න පුරුදුවෙලා ඉන්න නාස්තිකාර කෙල්ලෙක්ට, මං හොඳ සුකුරුත්තන් කෝපි එකක් හදලා දුන්නා කියලා එයා සමහරවිට හිතනවා ඇති. මම හරිහමන් කෝපි කෝප්පයක් තොලගාලා කොයිතරම් දිග කාලයක් ගෙවිලා ගිහින් තියෙනවද කියලා එයාට කිසිම අදහසක් නැනෙ. කොටින්ම, මම රැඳවුම් නිවාසෙ ඉඳපු මාස කීපයෙදිත් එයාලා, හිරගෙදර අතීතයක් තියෙන, හිරගෙදර ඉඳපු කෙල්ලන්ට, අර බන්ධනාගාර කෝපිමයි දුන්නේ.

මට ඇඬෙන්න එනවා.

මට ඇඬෙනවා.

බාර් එකේ එහා කෙළවරේ කාටහරි එයාගෙ අවධානය මාරුවුණු වෙලාවේ, මං මගේ කෝපි එකෙන් උගුරක් බීලා ඇස් දෙක පියාගත්තා. මට ඇඬෙනවා. ඔව්, මං අඬනවා. මොකද, ජීවිතේ මට කොයිතරම් නපුරු, අමානුෂික විදියට සැලකුවද, මට ජීවත්වෙන එක කොයිතරම් අමාරු වුණාද කියනවා නම්, ජීවිතේ අතාරින්න තරම් මට වුවමනා වෙලා තියෙනවා. එකපාරක් නෙවෙයි, කීපවතාවක්ම ජීවත්වීම කියන දේ නවත්තන්න මට හිතිලා

MUSESBOOKS®

Copyrighted Material



තියෙනවා. ඒත් ඒ අතරමැද හිටිගමන් මෙහෙම දේවල් සිද්ධවෙනවා. මායාකාර නිමේෂයන්. ජීවිතේ සතුට කියන්නේ, අපි සදාකාලිකව හිමි කරගන්න දෙයක් නොවෙයි, සැරින් සැරේ ජීවිතේට ගොඩවදින දෙයක් බව අපි ඒ මායාකාර තත්පරවලදි තේරුම්ගන්නවා. සතුට කියන්නේ, ජීවිතේ ඉස්සරහට ඇදගෙන යන්න ප්‍රමාණවත් තරම් පුංචි මාත්‍රාවලින් ලැබෙන දෙයක්.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# සිව්වැනි පරිච්ඡේදය

## ලෙපජ්ර්

ළමයෙක් අඬද්දි මොනවද කරන්න ඕනෙ කියලා මම දන්නවා. ඒත් තරුණියක් අඬද්දි කරන්න ඕනෙ කිසිම දෙයක් ගැන මට අදහසක් නෑ. ඉතින් එයාට තමන්ගෙ පාඩුවේ ඒ කෝපි කෝප්පය බොන්න දීලා, පුළුවන් තරම් එයාගෙන් ඈත්වෙලා ඉන්න එකයි මම දැන් මේ කරන්නෙ.

පැයකට විතර කලින් එයා බාර් එක ඇතුළට ඇවිදන් ආපු වෙලාවේ ඉඳලා, මට එයා ගැන වැඩි යමක් දැනගන්න පුළුවන් වුණේ නෑ. ඒත් එක දෙයක් නම් මට සහතිකවම කියන්න පුළුවන්. එයා මෙහාට ආවේ කාවවත් මුණගැහෙන්න බලාගෙන නෙවෙයි. එයා මෙතැනට ආවේ හුදෙකලා වෙන්න. ගෙවුණු පැය ඇතුළෙ තුන්දෙනෙක් එයාට කිට්ටුවෙන්න බැලුවා. එයා ඒ කිසිම කෙනෙකුගේ මූණ දිහා බලන්න, ඔළුව උස්සන්න තරම්වත් වද වෙන්නෙ නැතුව, අතක් වනලා ඒ හැමකෙනෙක්වම ප්‍රතික්ෂේප කළා.

එයා තමන්ගේ පාඩුවේ, නිහඬවම කෝපි එක බිබී හිටියා. වෙලාව, තවම යන්තම් හවස හත වුණා විතරයි. ඉතින් එයා මේ තාම, සැර ජාති ගන්න හෙමින් හෙමින් සූදානම් වෙන ගමන් ඉන්නවා වෙන්නත් පුළුවන්. එක අතකට එහෙම වුණේ නැත්නම් හොඳයි. බාර් එකකට ඇවිත්, බාර් එකකින් පිළිගන්වන්නෙ නැති තරම් අමුතු දේවල් ඇණවුම් කරන ගමන්, තමන්ට ළංවෙන්න හදන පිරිමින්ව තඹයකටවත් මායිම් නොකරන - කොටින්ම, එයාලගෙ මූණ දිහා බලන්න ඔළුව උස්සන්නෙවත් නැති - මේ කෙල්ල ගැන මට තියෙන්නේ කුතුහලයක්.

www.musesbooks.com

Copyrighted Material



මේරි ඇනුයි, රාසියි දෙන්නා එනකල්, මෙතැන වැඩ කරන්නෙ මායි රෝමනුයි විතරයි. දැන් ටික ටික මෙතැනට වැඩිපුර සෙනඟ ඇදෙන්නයි, වැඩ වැඩිවෙන්නයි පටන්අරන්. ඉතින් මට වුවමනා වුණු තරම්ම එයාට අවධානය දෙන්න විදියක් නෑ. වුවමනා වුණු තරම කියන්නේ... මගේ සම්පූර්ණ අවධානයම! ඒත් තමන්ගෙ පුද්ගලික අවකාශය ඇතුළට මම ඕනෙවට වඩා ඇවිල්ලා කියලා එයාට නොදැනෙන තරමට, මම එයා ගැන සෝදිසියෙන් හිටියා.

එයා කෝපි එක ඉවර කරපු ගමන්, ඊළඟට මොනවද ඕනෙ කියලා අහන්න මට වුවමනා වුණත්, මම ඒ අදහස වෙනස් කරගත්තා. ඒ වෙනුවට මං කළේ, ඒ හිස් කෝපි කෝප්පය එක්ක එයාට තව මිනිත්තු දහයක් විතර ඔහේ ඉන්න ඉඩ දීපු එක. අන්තිමට මම එයාගේ සමීපයට ගියේ, එයාට ඒ විදියට මිනිත්තු පහළොවක්ම ඉන්න දීලා.

ඒ අතරමැද ගෙවුණු කාලෙදි මම සැරෙන්සැරේ එයා දිහා හොරෙන් බැලුවා නම් තමයි. එයාගෙ මූණ හරියට කලාකෘතියක් වගේ. ඒ මූණේ පින්තූරයක් රාමු කරලා, කෞතුකාගාරයක බිත්තියක එල්ලලා තිබුණා නම් කොයිතරම් හොඳද? එහෙනම් මට ඒක ඉස්සරහට වෙලා, ඇති කියලා හිතෙන තරම් වෙලාවක් ඒ දිහා බලන් ඉන්න තිබුණනේ. ඒ වෙනුවට මට කරන්න වුණේ, එහෙන් මෙහෙන් සැරින්සැරේ එයාගෙ දිහා හොරෙන් බල බලා, ලෝකෙ තියෙන අනික් මූණුවල තියෙන කොටස්ම, එයාගෙ මූණේ ඒ තරම් සුන්දර විදියට එක්කාසු වෙලා තියෙන අපූරුව හිතෙන් අගය කරන එක.

සති අන්තය පටන්ගන්න හවස් වරුවක, ඒ තරම් සරල, සාමාන්‍ය විදියට ඇඳලා බාර් එකකට එන මිනිස්සු හරිම දුර්ලභයි. ඒත් එයා අමුතුවෙන් හැඩවැඩ වෙලා හිටියෙ නෑ. එයා ඇඳන් හිටියෙ පාට වියැකිලා ගිය මවුන්ටන් ඩිව් ටී-ෂර්ට් එකකුයි, ඩෙනිම් කලිසමකුයි. ඒත් එයාගෙ ඇස්වල කොළ පාටට, ඒ ටී-ෂර්ට් එකේ කොළ පාට කොයිතරම් අපූරුවට ගැළපුණාද කියනවා නම්, එයා ඒ තිතටම ගැළපෙන පාට තියෙන ටී-ෂර්ට් එක හොයන්න පණ යනකල් මහන්සි වෙන්න ඇති කියලා හිතෙන තරම්. ඒත් එයා ඒ ටී-ෂර්ට් එක ගැන අංශුමාත්‍රයක්වත් හිතපු නැති බව මට විශ්වාසයි. එයාගේ කොණ්ඩෙ තිබුණෙ රතු-දුඹුරු පාටක්. නිකටට පොඩ්ඩක් පහළින් ඉවරවෙන විදියට, තනි දිගට කපපු කොණ්ඩයක්. එයා

MUSESBOOKS®

www.musesbooks.com

Copyrighted Material



සැරින්සැරේ ඒ කෙස් අතරින් අත් දෙක යවනවා. එයා එහෙම කරන හැම වතාවකම පේන්නෙ, එයා පුළුවන් තරම් ඇකිළිලා, නොපෙනී ඉන්න උත්සාහ කරනවා වගේ. අන්න ඒ වෙලාවට මට හිතෙන්නෙ එකම දෙයයි. බාර් එකේ ඒ පැත්තට ඇවිදගෙන ගිහින්, එයාව දෑතින්ම උස්සලා, වැලඳගන්න ඕනේ!

එයාගේ කතාව මොකක්ද?

මට දැනගන්න වුවමනාවක් නෑ.

මට දැනගන්න අවශ්‍යතාවයක් නෑ.

මම මේ බාර් එකේදි මුණගැහෙන ගෑනු ළමයි එක්ක ආදර පලහිලව් තියාගන්නෙ නෑ. ඔව්, මම ඒ නීතිය දෙපාරක්ම කැඩුවා තමයි, ඒ දෙපාරම මම නැත්තටම නැතිවෙලා ගියා කිව්වොත් හරි.

අනෙක් කාරණේ තමයි, මේ ගෑනු ළමයා ගත්තම, එයාගේ තියෙනවා මොකක්දෝ හිත තිගස්සවන විදියේ දෙයක්. ඒක මොකක්ද කියලා මට හරියටම කියන්න බෑ. ඒත් මම එයාට කතාකරද්දි, මට දැනෙන්නේ මගේ කටහඬ පපුව ඇතුළේ හිරවෙනවා වගේ. ඒක මේ මට එයා දැක්කම හුස්මගන්න අමතක වෙනවා වගේ තීව්‍ර සංවේදනයක් නෙවෙයි. ඊට වඩා අමුතු, ඒත් සැලකිය යුතු තරම් ප්‍රබල විදියට දැනෙන දෙයක්. හරියට නිකන්, එයත් එක්ක පැටලෙන්න එපා කියලා මගේ මොළේ අනතුරු අඟවනවා වගේ.

*රතු කොඩියක්! අනතුරක්! නතරවෙයන්!*

ඒත් ඇයි?

මම එයාගේ කොෆී මග් එක අරගන්න අත දික්කළාම, අපේ ඇස් මුණගැහුණා. එයා අද රෑ එකම එක වතාවක්වත්, වෙන කිසිම කෙනෙක් දිහා බැලුවේ නෑ. එයා බැලුවේ මං දිහා විතරයි. හරිනම් මම ඒ ගැන ආඩම්බර වෙලා, සතුටෙන් ඉපිලිලා යන්න ඕනෙ. ඒත් මට දැනෙන්නෙ සතුටක් නෙවෙයි, බයක්!

මම වෘත්තීමය වශයෙන් ෆුට්බෝල් සෙල්ලම් කරනවා. මගේම කියලා තැබෑරුමක් තියෙනවා. ඒත්, ලස්සන ගෑනු ළමයෙකුගේ ඇස් දිහා පොඩිම වෙලාවක්වත් බලන්න බයවෙලා. ඒක මගේ ටින්ඩර් ගිණුමේ, හැඳින්වීමේ කොටසට නම් මරු! සෙල්ලම් කරන්නෙ *බ්‍රොන්කොස්ලට. තියෙන්නෙ තැබෑරුමක්. ඒත් ඇසට ඇස බලන්න බයයි!*

"ඊළඟට මොනවද?" මම ඇයගෙන් ඇහුවා.

"වයින්. සුදු වයින්."

www.musesbooks.com

Copyrighted Material



බාර් එකක අයිතිකාරයෙක් වෙන එකයි, නොබී ඉන්න එකයි කියන්නෙ ලේසියෙන් සමබර කරගන්න පුළුවන් දෙයක් නෙවෙයි. මම කැමතියි අනෙක් හැමෝම නොබී ඉන්නවා නම්. ඒත් අනෙක්අතට මගේ බාර් එකට පාරිභෝගිකයොත් ඕනෙ. මම වයින් වීදුරුවක් වත්කරලා, ඒක එයාගේ ඉස්සරහින් තිව්වා.

රෙදි කෑල්ලක් අතින් අරන්, වීදුරු ටිකක තෙත මාත්තු කරන විදියට මම එයාගෙ අහල පහලින්ම නතර වුණා. ඇත්තම කතාව නම්, මේ වීදුරු සේරම ඊයෙ වේළපු ඒවා. වයින් වීදුරුව දිහා බලන් ඉන්න එයා යන්තමින් කෙළ පිඬක් ගිලගන්නවා මට පේනවා. හරියට නිකන්, මේ වයින් එක බොන්න ඕනෙද කියලා එයාටම විශ්වාසයක් නෑ වගේ. ඒ අංශුමය තත්පරය ඇතුළේ එයාගෙන් පෙනුණු පැකිළීම, එහෙමත් නැත්නම් පසුතැවීම දැකපු ගමන් ඇයට ඇල්කොහොල් එක්ක ප්‍රශ්නයක් තියෙන බව හිතාගන්න මට ඒක ප්‍රමාණවත්. කෙනෙක් තමන්ගේ සිහිකල්පනාව නැති කරගන්න තීරණය කරන මොහොතක් තියෙනවානේ. මට ඒ වෙලාව හරියටම අඳුරගන්න පුළුවන්. එයාලා තමන්ගෙ බීම වීදුරුව දිහා බලන බැල්මෙන්ම මට ඒක අඳුරගන්න පුළුවන්.

බොන එක හිතට වදයක් වෙන්නෙ, බේබද්දන්ට විතරයි.

ඒත් එයා වයින් වීදුරුව බිව්වෙ නෑ. ඒ වෙනුවට එයා කළේ හෙමින් හෙමින් සෝඩා වීදුරුව තොලගාපු එක. සෝඩා වීදුරුව හිස්වෙනකල්ම. මම හිස් වීදුරුව අරගන්න අත දික්කරද්දිම, එයත් ඒකම කළා.

අපේ ඇඟිලි එකිනෙකට ස්පර්ශ වුණාම, මට දැනුණේ මගේ කටහඬට අමතරව තව මොනවහරි දෙයක් මගේ පපුව අස්සේ හිරවෙලා තියෙනවා වගේ. සමහරවිට ඒ, අමතර හෘද ස්පන්දන කිහිපයක් වෙන්න ඇති. එහෙම නැත්නම් පුපුරලා යන ගිනි කන්දක් වෙන්න ඇති.

එයා තිගැස්සිලා මගේ ඇඟිලිවලින්, එයාගේ ඇඟිලි ඈත් කරගත්තා. ඊටපස්සෙ අත් දෙකම උකුළ උඩින් තියාගත්තා. මම හිස් සෝඩා වීදුරුවයි, තවම පිරිලා තිබුණ වයින් වීදුරුවයි දෙකම අතට ගත්තා. ඇය අඩුම තරමේ ඔළුව උස්සලා, මගේ දිහා බලලා ඒ ඇයි කියලවත් ඇහුවේ නෑ. එයා සුසුමක් හෙළනවා මට ඇහුණා. සමහරවිට ඒක සැනසුම් සුසුමක් වෙන්න ඇති. මම වයින් වීදුරුව

www.musesbooks.com

Copyrighted Material



අයින් කරපු එක එයාට සැනසීමක් ගේන්න ඇති. එයා මොන එහෙකට ඒ වයින් එක ඕඩර් කළාද මන්දා!

මම එයාගේ සෝඩා වීදුරුව ආයෙම පුරවලා, එයා අහක බලනකල් ඉඳලා වයින් ටික සින්ක් එකට හලලා, වයින් වීදුරුව හෝදලා දැම්මා.

එයා තව ටික වෙලාවක් සෝඩා වීදුරුව තොලගෑවා. හැබැයි, මගේ දිහාට එල්ලවුණු එයාගෙ බැල්ම නම් ඒ වෙනකොට නැවතිලා. සමහරවිට මම එයාගෙ හිත නරක් කරන්න ඇති.

මම කෙල්ල දිහා බලන් ඉන්න විදිය රෝමන්ට තේරිලයි තිබුණේ. මිනිහා කවුන්ටර් එකට වැළමිට තියලා, මගේ දිහාට බර වුණා. "ඩිවෝස්ද, නැත්නම් මැරිලද?" රෝමන් ඇහුවා.

තනියම බාර් එකට ඇවිත්, වෙනම ලෝකෙක ඉන්නවා වගේ අන්දමන්ද වෙලා ඉන්න අයව දැක්කාම, ඒකට හේතුව අනුමාන කරන්න රෝමන් හැමතිස්සෙම කැමතියි. ඒ ගෑනු ළමයා නම් මෙහාට ඇවිත් තියෙන්නෙ දික්කසාදයක් නිසා බවක් පේන්න නෑ. සාමාන්‍යයෙන් ගෑනු දික්කසාද වුණාම කරන්නෙ, යාළුවො රංචුවක් එක්ක බාර් එකට කඩාවැදිලා, හොඳට විනෝදවෙන එක. අහ්, තව එයාලා අතරින් ඇත්තටම දික්කසාදයට මූණදීපු කෙනා, 'එක්ස්-වයිෆ්' කියලා සාටකේකුත් ඔතාගෙනයි එදාට එන්නෙ!

මේ කෙල්ල දුකෙන් ඉන්න බවක් නම් පේන්න තියෙන එක ඇත්ත. හැබැයි, ඒක මේ කවුරුහරි කෙනෙක් මැරිලා ශෝකවෙන කෙනෙකුගෙන් පේන විදියේ දුකක් නෙවෙයි.

"මං නම් කියන්නෙ ඩිවෝස්!" රෝමන් කිව්වා.

මම මිනිහට උත්තර දුන්නෙ නෑ. එයාගේ දුක්බර කතාව මොකක් වුණත්, ඒක අනුමාන කරන්න යෑම ඒ හැටි හොඳ වැඩක් විදියට මට පෙනුණෙ නෑ. ඇත්තම කියනවා නම්, ඒක දික්කසාදයක්වත්, මරණයක්වත්, අඩුම තරමේ නරක දවසක්වත් නොවෙන්න ඇති කියලා මම ප්‍රාර්ථනා කළා. ඇයට යහපත් දේවල් විතරක් වෙනවා නම් මම වැඩියෙන් කැමතියි. මොකද, එයාගෙන් පේන්න තිබුණේ, බොහෝම දීර්ඝ කාලෙකින් කිසිම හොඳ දෙයක් වෙලා නැති කෙනෙකුගේ පෙනුමක්.

මං ඒ ගෑනු ළමයා දිහා බලන් ඉන්න එක නතර කරලා, අනික් ගනුදෙනුකරුවන්ගේ වුවමනා එපාකම් බලන්න ගියා. මම එහෙම කළේ, ඇයට පාඩුවේ, තනියම ඉන්න ඉඩදෙන්න ඕනෙ නිසා වුණත්,

MUSESBOOKS®

www.musesbooks.com

Copyrighted Material



එයා ඒක පාවිච්චි කළේ බාර් කවුන්ටරෙන් සල්ලි තියලා, රහසින්ම පිටවෙලා යන්න.

එයා වාඩිවෙලා ඉඳපු උස බංකුවයි, ඩොලර් දහයේ සන්තෝසම් මුදලයි දිහා මම තත්පර කීපයක් බලාගෙන හිටියා. එයා ගිහින්. මම ඒ තරුණියගේ නමවත් දන්නෙ නෑ. ඒ වගේම, මං එයාගෙ කතාව මොකක්ද කියලා දන්නෙත් නෑ. ඇයව ආයෙ කවදාකවත් මට මුණගැහෙයිද නැද්ද කියලා මං දන්නෙ නෑ. ඉතින් එකපාරටම මගේ කකුල්වලට පණ ආවා. කවුන්ටරෙන් එළියට ඇවිත්, බාර් එක මැද්දෙන් මං දුවගෙන ආවේ ඉස්සරහ දොර දිහාට. මේ දැන් එයා හෙමින් මාරුවෙලා, එළියට ගියපු දොර දිහාට.

මම එළියට එද්දි, අහස පුරාම පැතිරිලා තිබුණේ ගිනිගන්නවා වගේ පාටක්. අඳුර වැටෙන්න කලින්, තැබෑරුමෙන් පිටත තියෙන එළිය කොයිතරම් සාහසිකද කියලා අමතක වුණ මම, ඇස් දෙක අතකින් වහගත්තා. හැමදවසකම මේ වෙලාවට මෙහෙමයි.

මම එයාව දකිද්දි, එයා මගේ පැත්තට හැරෙනගමන් හිටියේ. අපි අතර තිබුණේ අඩි දහයක විතර පරතරයක්. ඉර තිබුණේ ඇයට පිටිපස්සෙන් නිසා, මට වගේ ඉර එළියෙන් ඇස් දෙක මුවාකරගන්න වුවමනාවක් ඇයට තිබුණේ නෑ. එයාගේ හිසේ හැඩේට ඉරඑළිය කොටසක් අවහිර වෙලා තියෙද්දි පෙනුණේ හරියට එයාගෙන් රැස් වළල්ලක් විහිදෙනවා වගේ.

"මම කවුන්ටරෙන් සල්ලි තියලයි ආවේ," එයා කිව්වා.

"මම දන්නවා."

අපි නිහඬවම මොහොතක් එකිනෙකා දිහා ඔහේ බලාගෙනම හිටියා. මම දන්නෙ නෑ, මොනවද මං කියන්න ඕනෙ කියලා. ඉතින් මං මෝඩයෙක් වගේ ඔහේ හිටගෙන එයා දිහා බලාගෙන හිටියා.

"එහෙනම් මොකක්ද?"

"මුකුත් නෑ," මං කිව්වා. ඒත් ඒ මොහොතෙම මං මගේ වචන තෝරාගැනීම ගැන පසුතැවෙන ගමන් හිටියේ. අපරාදේ, මට තිබ්බේ 'හැමදෙයක්ම' කියලා කියන්න.

එයා මගේ දිහා බලාගෙන හිටියා. මං ඊළඟට කළේ මං කවදාවත්ම කරන්නෙ නැති දෙයක්. මම කොහෙත්ම නොකළ යුතු දෙයක්. ඒත් මං දැනන් හිටියා, මං එයාට යන්න දුන්නොත් මට මේ දුක්බර පෙනුමක් තියෙන කෙල්ල ගැන හිතන එක නවත්තගන්න බැරිවෙන විත්තිය. ඩොලර් දහයක සන්තෝසමක් මට තියලා ගියපු

MusesBooks ®

www.musesbooks.com

Copyrighted Material



දුක්බර කෙල්ල! ඩොලර් දහයක් තියා මට සන්තෝසමක් දෙන්න වත්කමක් ඇයට කොහෙත්ම නැති වග මට ඉවෙන් වගේ දැනෙනවා.

"ඔයා අද රෑ එකොළහට ආයේ එන්න ඕනෙ!" මම එයාට ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්න හරි, එන්න බැරි එකට නිදහසට කරුණු කියන්න හරි අවස්ථාවක් දුන්නෙ නෑ. මම ආපහු තැබෑරුම ඇතුළට ගියේ, එයාට ආපහු එන්න හිතෙන තරමට ප්‍රමාණවත් කුතුහලයක් මගේ ඉල්ලීමෙන් ඇති කරාවි කියලා බලාපොරොත්තු වෙන ගමන්.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# පස්වැනි පරිච්ඡේදය

## කේනා

මං දැන් ඉන්නෙ නමක් නැති පූස් පැටියත් එක්ක, හුළං පුරවන මෙට්ටයක් උඩට වෙලා. මේ ඉන්න මුළු වෙලාවෙම මම කළේ එකම දෙයක් විතරයි. ඒ තමයි, අර බාර් එකට ආපහු නොයා ඉන්න මට තියෙන හේතු සේරම ගැන කල්පනා කරන එක.

මම මේ ටවුමට ආවේ කොල්ලො මුණගැහෙන්න බලාගෙන නෙවෙයි. කොටින්ම, අර බාර්-ටෙන්ඩර් තරම් කඩවසම් පෙනුමක් තියෙන කොල්ලො වුණත්! මම මෙහාට ආවේ, මගේ දුව වෙනුවෙන්! එච්චරයි.

හෙට වැදගත් දවසක්. හෙට මම ඉන්න ඕනෙ වෙන කවදාකවත් නැති තරම් ශක්තිමත් විදියට. ඒත් අර බාර්-ටෙන්ටර් මගේ වයින් වීදුරුව ආපහු අරගන්න එකෙන් කළේ, මාව තවත් දුර්වල කරන එක. එයා ඒක හිතාමතා කරපු දෙයක් නෙවෙයි තමයි. හැබැයි සිද්දවුණේ ඒක. වයින් වීදුරුව එහෙම ඇදලා අරන් අයින් කරන්න තරම්, එයා මගේ මූණෙන් මොනවද දැක්කෙ කියලා නම් මං දන්නෙ නෑ. ඇත්තටම මං ඒ වයින් වීදුරුව බොන්න නෙවෙයි හිටියේ. මම ඒක ඇණවුම් කළේ, වයින් වීදුරුව නොබී ඉන්නකොට දැනෙන 'පාලනය' කියන හැඟීම විඳගන්න. ඒක දිහා බලාගෙන, ඒකෙ සුවඳ විඳ විඳ ඉඳලා, ඒක අතෑරලා දාලා යන්න. එහෙම කරලා, මම එතැන වාඩිවෙන වෙලාවේ හිටියට වඩා ශක්තිමත් විදියට එළියට එන්න.

මට දැන් දැනෙන්නෙ නොසන්සුන්කමක්. චංචල හැඟීමක්. මං ඒ වයින් වීදුරුව දිහා බලන් ඉඳපු විදිය දැකලා, එයා ඒක අයින්

www.musesbooks.com

Copyrighted Material



කරපු හැටි! එකත් එකටම එයා හිතන්න ඇති, මට 'ඇල්කොහොල් ප්‍රශ්නයක්' තියෙනවා කියලා.

නෑ. මට එහෙම ප්‍රශ්නයක් නෑ. මම අවුරුදු ගාණකින් ඇල්කොහොල් බිංදුවක් කටේ තියලා නෑ. එක දවසක් රෑ, ඇල්කොහොල් එක්ක මිශ්‍ර වුණු බෙදවාචකයකින් මගේ ජීවිතේම විනාශවෙලා ගියාට පස්සෙ, මම ඇල්කොහොල් බිංදුවක්වත් අරගෙන නෑ. මගේ ජීවිතේ ඒ අවසානයට ගෙවිලා ගිය අවුරුදු පහ, මාව ආපහු අරගෙන ආවේ මේ නගරයට. මේ නගරය මාව නොසන්සුන් කරනවා. මගේ ස්නායු සන්සුන් කරගන්න පුළුවන් එකම විදියයි මම දන්නේ. ඒ, මගේ ජීවිතේ සහ මගේ තීරණ, තවමත් මගේ පාලනය යටතේ තියෙනවා කියලා දැනෙන දේවල් කරන එක.

*අන්න ඒ නිසයි, මට ඒ වයින් වීදුරුව ප්‍රතික්ෂේප කරලා දාන්න ඕනේ වුණේ. ඉලව්ව!*

දැන් ඉතින් මං දන්නවා, අද රෑට නම් මට හරිහැටි නිදාගන්න ලැබෙන්නෙ නැති විත්තිය. මම යමක් දිනාගත්තා කියලා හිතන්න හේතුවක් නෑ. එයා ඒ කරපු වැඩෙන් වුණේ, මට සම්පූර්ණයෙන්ම ඒකෙ අනෙක් පැත්ත දැනෙන්න ගත්ත එක! අද රෑට මට හොඳ නින්දක් ලබාගන්න ඕනෙ නම්, මට සිද්දවෙනවා මට ඕනෙ කරන වෙන මොනවහරි දෙයක් ප්‍රතික්ෂේප කරන්න.

*එහෙම නැත්නම්, කෙනෙක්ව!*

මට දීර්ඝ කාලයකින් කාවවත් ඕනෙ වෙලා නෑ. හරියටම කියනවා නම්, මට ස්කොට් මුලින්ම මුණගැහුණ දවසේ ඉඳන්! ඒත් අර බාර්-ටෙන්ඩර්ට තිබුණේ තරමක සරාගී පෙනුමක්. තව, එයාට ලස්සන හිනාවක් තියෙනවා. ඒ විතරක් නෙවෙයි, එයාට අපූරුවට කෝපි හදන්නත් පුළුවන්. ඇරත්, එයා දැනටම මට ආපහු එන්න කියලා ආරාධනා කරලා තියෙන එකේ, මට තියෙන්නෙ ආපහු එහෙට ගිහින්, එයාව ප්‍රතික්ෂේප කරන්න. සරලයි!

ඊටපස්සේ හොඳ නින්දක් දාලා, උදේට ඇහැරිලා මගෙ ජීවිතේ වැදගත්ම දවසට මූණදෙන්න මට පුළුවන්.

මට මගේ අලුත් පූස් පැටියවත් අරන් යන්න තිබුණා නම් කොච්චර හොඳද? මාත් එක්ක යන්න යාළුවෙක් වගේ කෙනෙක් ඕනෙ බව මට දැනෙනවා. ඒත් මම ඉස්සෙල්ලා කඩෙන් ගෙනත් දුන්නු අලුත් කොට්ටේ උඩ එයා හොඳ සැපට නිදි.

MUSESBOOKS

Copyrighted Material



මම වැඩි දෙයක් ගත්තෙ නෑ. හුළං පුරවන්න පුළුවන් මෙට්ටයකුයි, කොට්ට කීපයකුයි, පොරෝනායි, ක්‍රැකර්ස් එක්ක චීස්, පූස් කෑම එක්ක කැට් ලිටර්. මම මිලදී ගත්තේ එච්චරයි. මොකද මං තීරණය කරලයි තිබුණේ, මේ නගරේ ඉන්නකල් මම එක වතාවකට දවස් දෙකක් ගැන විතරක් හිතනවා කියලා. හෙට දවස කොහොම වේවිද කියලා මට නිශ්චිතව දැනගන්න පුළුවන් වෙනකල්, මම මාස හයක් තිස්සේ වැඩ කරලා ඉතුරු කරපු සල්ලි නාස්ති කරන එක මහ පිස්සු වැඩක්නේ. දැනටමත් මගේ ඉතුරුම් වේගයෙන් අඩුවෙමිනුයි තියෙන්නෙ. ඉතින්, මම කැබ් එකකට කතාකරන අදහස අතෑරලා දැම්මා.

අපාර්ට්මන්ට් එකෙන් පිටත්වෙලා, එතැන ඉඳන් තැබෑරුමට වෙනකල් ඇවිදගෙන ආවත්, මම මගේ පසුම්බියවත්, සටහන් පොතවත් අරගෙන ආවේ නෑ. මට ඕනේ මගේ රියදුරු බලපත්‍රයයි, අපාර්ට්මන්ට් එකේ යතුරයි විතරයි. මගේ අපාර්ට්මන්ට් එකේ ඉඳන් තැබෑරුමට තියෙන්නෙ සැතපුම් එකහමාරක විතර ගමනක්. ඒත් ඒක ප්‍රශ්නයක් නෑ, අද කාලගුණයත් හොඳයි. අනික, පාර දිගටම හොඳ එළියකුත් තිබුණා.

තැබෑරුමේ කවුරුහරි මාව අඳුරගනී කියලා මට පොඩි බයක් තිබුණෙ නැතුවම නෙවෙයි. කොටින්ම, මම මේ විදියට ඇවිදගෙන යද්දි පවා ඒ සිතිවිල්ල මගේ ඔළුවේ හොල්මන් කළා. ඒත් අවුරුදු පහකට කලින් තිබුණට වඩා මගේ පෙනුම සම්පූර්ණයෙන්ම වෙනස්වෙලයි තියෙන්නෙ. ඉස්සර මං, මගේ පෙනුම නඩත්තු කරන එක ගැන බොහොම බරපතළ විදියට හිතුවා. හැබැයි, අවුරුදු පහක සිරදඬුවම් කාලය, කොණ්ඩෙට දාන ඩයි හරි, හෙයා එක්ටෙන්ෂන් ගැන හරි මගේ තිබුණු උනන්දුව නැති කරලා දාලා තිබුණා. බොරු ඇස්පිල්ලම්, කෘත්‍රිම නියපොතු ගැනත් එහෙමමයි.

ස්කොටී ඇරුණම වෙන යාළුවො ඇතිකරගන්න තරම් දීර්ඝ කාලයක් මම මේ නගරේ ජීවත්වුණේ නෑ. ඉතින්, මෙහෙ ඉන්න මිනිස්සුන්ගෙන් වැඩිහරියක් මම කවුද කියලවත් දන්නවද කියලා මට නම් සැකයි. එයාලගෙන් කීපදෙනෙක් මං ගැන දන්නවා ඇති. ඒත් මං ගැන ඇබින්දක්වත් වදවෙන, මං නැතුව පාළු හිතෙන කිසිම කෙනෙක් නැති නගරෙක, මාව එහෙම අඳුරගන්න විදියක් නෑ.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



පැට්‍රික්, ග්‍රේස් දෙන්නා නම් සමහරවිට මාව දැකලා, අඳුරගන්න ඉඩ තියෙනවා. ඒත් මං හිරේ යන්න කලින් එයාලව මුණගැහිලා තියෙන්නෙත් එකපාරයිනේ.

*හිරගෙදර.* මට කවදාවත් ඒ වචනෙ කියන්න හුරුවෙන්න බැරිවෙයි. ඒක කට ඇරලා කියන්න අමාරුම ජාතියෙ වචනයක්. පත්තරේක තිබිලා කියවනකොට, ඒ වචනෙ මහ ලොකු කටුක බවක් දැනෙන්නෙ නෑ. ඒත් 'හිරගෙදර' කියලා කට ඇරලා උස් හඬින් කියද්දි නම්, ඒක අන්තිම දරුණුයි!

පහුගිය අවුරුදු පහ මම කොහෙද හිටියේ කියලා හිතනකොට, 'මධ්‍යස්ථානේ' කියලා මගේ ඔළුව ඇතුළෙන් කියවෙන එකට මම කැමතියි. එහෙම නැත්නම්, 'මං මෙහෙන් ගිහින් ඉඳපු කාලෙ' විදියටයි මං ඒ ගෙවපු කාලය ගැන හිතන්නෙ. ඊට වඩා දුරට ඒ ගැන හිතන්න මට ඕනෙ නෑ. 'මං හිරේ ඉඳපු කාලේ' කියන එක, මට කවදාවත් කියන්න පුරුදුවෙන්න පුළුවන් දෙයක් නෙවෙයි.

ඒත් මේ සතියෙ රස්සාවක් හොයද්දි, මට එහෙම කියන්න වෙයි. 'ඔයා මීට කලින් කවදහරි අපරාදෙකට සිර දඬුවම් විඳලා තියෙනවද?' එයාලා එහෙම අහයි. එතකොට මට, 'ඔව්, මම සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයකට අවුරුදු පහක් සිරගත වෙලා හිටියා,' කියලා උත්තර දෙන්න සිද්දවෙනවා.

එතකොට එයාලා එක්කෝ මට රස්සාව දේවි, එහෙම නැත්නම් නොදී ඉඳීවි. හුඟක් වෙලාවට නොදේවි.

ගෑනියක් වුණාම ලෝකෙ ඔයාට සලකන්නෙ වෙනස්, අමුතුම විදියකට. ඒක හිරගෙදර කියලත් වෙනසක් නෑ. ගෑනු කෙනෙක් හිරේට ගියා කියලා කිව්වම, මිනිස්සු එයා ගැන හිතන්නෙ කුණුගොඩක්, ගණිකාවක්, කුඩුකාරියක්, එහෙම නැත්නම් හෙරක් විදියට. ඒත් පිරිමියෙක් හිරේ හිටියානම්, මිනිස්සු එයාලගේ නරක සිතිවිලි ඉස්සරහින් ගෞරව ලාංඡන එකතු කරනවා. හරියට, කුණුගොඩක්, *ඒ වුණාට පොරක්! කුඩුකාරයෙක්, හැබැයි තදයෙක්! හොරෙක්, හැබැයි වැඩකාරයෙක්!*

පිරිමින්ටත් ඒකෙන් නරක නාමයක්, කැළැලක් ඇතිවෙනවා තමයි. ඒත් ගෑනුන්ට අර වගේ ගෞරව ලාංඡනවත්, ඒ නරක නාමයෙන් ගැලවෙන්න අවස්ථාවක්වත් ලැබෙන්නෙ නෑ.

උසාවි ගොඩනැගිල්ලේ තිබුණු ඔර්ලෝසුවෙ වෙලාවට අනුව, මම නගරේ කඩවීදිය කිට්ටුවට එනකොට වෙලාව එකොළහයි

www.musesbooks.com

Copyrighted Material



තිහයි. පැය භාගයක්ම පරක්කු වෙලා තිබුණත්, එයා තාම මෙහේ ඇති කියලා මං හිතනවා.

කලින් තැබෑරුමට ආව වෙලාවේ, මම ඒකෙ නම ගැන ඒ හැටි අවධානයක් දුන්නෙ නෑ. සමහරවිට, ඒ දවල් හොඳට එළිය තිබුණු නිසා වෙන්න ඇති. එහෙම නැත්නම්, එතැන දැන් තියෙන්නෙ පොත් සාප්පුවක් නෙවෙයි කියලා දැනගත්තම දැනුණු කම්පනය හන්දා වෙන්න ඇති. ඒත් දැන් නම් මට තැබෑරුමේ නම පේනවා. *WARD'S* කියලා සටහන් වුණ නියෝන් නාම පුවරුවක් එතැන දොරේ එල්ලලා තිබුණා.

මම ටික වෙලාවක් එතැන නැවතිලා ඇතුළට යනවද නැද්ද කියලා කල්පනා කළා. මම මෙහෙම ආව එකම, අඩු-වැඩි වශයෙන් මේ හාදයට පණිවුඩයක් දෙනවා. ඒක මට එයාට දෙන්න ඕනෙ වුණු පණිවුඩයමද කියලා මට විශ්වාසයක් නෑ. ඒත් අනෙක්අතට මට ඉතිරිවෙලා තිබුණෙත් එක විකල්පයයි. ඒ, ආපහු අපාර්ට්මන්ට් එකට ගිහින්, මගේ කල්පනා ලෝකෙ තනිවෙන එක.

පහුගිය අවුරුදු පහ පුරාම මම ඒ කල්පනා ලෝකෙ තනිවෙලා, ඇති තරම් කාලය ගෙව්වා. මට මිනිස්සු දකින්න, සද්ද බද්ද අහගෙන ඉන්න, ඒ වගේම මට මඟහැරුණු හැමදේම අත්විඳින්න තිබුණේ දරුණු විදියෙ ආශාවක්. අර අපාර්ට්මන්ට් එකට ගියාම මට හිරගෙදර මතක්වෙන්න ගන්නවා. ඒක ඇතුළෙ ඕනෙවට වඩා තනිකමක් තියෙනවා. දරාගන්න බැරි තරම් නිහැඬියාවක් තියෙනවා.

මම තැබෑරුමේ දොර විවෘත කළා. ඒක ඇතුළෙ කලින්ට වඩා සෝෂාවයි, දුමයි පිරිලා. ඒ මදිවට අඳුරු ගතියත් වැඩිවෙලා. වාඩිවෙන්න හිස් පුටුවක් තිබුණෙ නැති හන්දා, මම මිනිස්සු පීරගෙන ගිහින්, නාන කාමරේ හොයාගත්තා. ඊටපස්සේ ශාලාවට ඇවිත් ටිකක් වෙලා බලන් හිටියා. එළියට ගිහින් තව ටිකක් වෙලා හිටියා. ඊටපස්සෙ ආයෙමත් සැරයක් මිනිස්සු අතරින් රිංගලා බැලුවා. ඔන්න අන්තිමට එක තැනක් හිස්වුණා. මම තැබෑරුම මැද්දෙන් ඇවිදගෙන ගිහින්, එතැනින් වාඩිවුණා. තනියම.

බාර් කවුන්ටරේට පිටිපස්සෙ කඩිසරව එහෙ මෙහෙ යන බාර්-ටෙන්ඩර් දිහා මං බලාගෙන හිටියා. එයාගෙ තියෙන, 'කිසිම හිතේ කරදරයක් නැති' පෙනුමට මං ආසයි. මිනිස්සු දෙන්නෙක් වාදෙකට පැටලිලා. ඒත් එයා නෙවෙයි ඒක සත පහකට ගණන්ගත්තේ. එයා කරපු එකම දේ, දොර දිහාට ඇඟිල්ල දික්කරපු එක විතරයි.

MUSESBOOKS®

Copyrighted Material



ඒ දෙන්නා එළියට යන්න ගියා. එයා ඒ වැඩේ නිතරම කරනවා. ඇඟිල්ලකින් එක එක දේවල් ඉඟිකරලා පෙන්නනවා. මිනිස්සු, එයාගේ ඇඟිල්ලෙන් ඉඟි කරන දේවල් කරනවා.

එතැන ඉඳපු අනෙක් බාර්-ටෙන්ඩර් එක්ක බැල්මක් හුවමාරු කරගන්න ගමන්, එයා තව ගනුදෙනුකාරයො දෙන්නෙක් දිහාට ඇඟිල්ල දික්කළා. අනෙක් බාර්-ටෙන්ඩර් ගිහින් අර දෙන්නගේ බිල හදලා දුන්නා.

තව සැරයක් එයා හිස් රාක්කයකට ඇඟිල්ල දික්කළාම, වේටර්වරියන්ගෙන් කෙනෙක් ආවා. මිනිත්තු කීපයක් යද්දි, ඒ හිස් රාක්කෙ පිරිලා තිබුණා.

ආයෙම වතාවක් එයා පොළොවට ඇඟිල්ල දික්කරලා පෙන්නුවා. ඒ ගමන අනෙක් බාර්-ටෙන්ඩර්, පියන් දෙකක් තියෙන දොරෙන් අතුරුදන්වෙලා ගිහින්, ආයෙම මතුවුණේ මොප් එකකුත් එක්ක. ඊටපස්සෙ ඒ මනුස්සයා එතන පොළොවේ ඉහිරිලා තිබුණ බීම ටික පිහිදලා දැම්මා.

එයා බිත්තියේ තිබුණ කොක්කකට ඇඟිල්ල දික්කළාම ආවේ, තව වේටර්වරියක්. එයා ගැබිනියක්. 'ඔයාට ස්තූතියි!' කියලා සද්දෙ ඇහෙන්නෙ නැති ගාණට කිව්ව එයා, ඒප්‍රන් එක ඒ කොක්කෙ එල්ලලා ගෙදර යන්න පිටත් වුණා.

බාර්-ටෙන්ඩර් ඇඟිල්ල දික්කරනවා. මිනිස්සු ඒවා කරනවා. ඊළඟට, ඇණවුම් බාරගන්න අවසාන මිනිත්තු කිහිපය කියලා එයා දැනුම්දුන්නා. මිනිස්සු එකා දෙන්නා පිටවෙලා යනවා. කිසිම කෙනෙක් ඇතුළුවෙන්නෙ නෑ.

එයා මගේ දිහා බැලුවේ නෑ. ඔව්, එකම එකපාරක්වත් බැලුවේ නෑ.

මෙතැන ඉන්න එක ගැන මගේ හිතේ දෙගිඩියාවක් ඇතිවෙමින් තියෙනවා. එයා කාර්යබහුලයි වගේ. සමහරවිට, මම කලින් එයා ගැන වැරදියට තේරුම්ගන්න ඇති. එයා මට ආයෙම එන්න කිව්වම, මම හිතුවේ ඒ මොකක්හරි හේතුවක් නිසා කියලා. ඒත් සමහරවිට ඒක එයා හැම ගනුදෙනුකාරයෙක්ටම කියන දෙයක් වෙන්න ඇති!

මම ඉඳන් හිටපු තැනින් නැඟිට්ටේ, මටත් අනෙක් අය වගේ හෙමින් දොරෙන් ලිස්සලා එළියට යන්න පුළුවන් වෙයි කියලා හිතාගෙන. ඒත් මං නැඟිටලා ඉන්නවා දැකපු එයා, ඇඟිල්ලක් දික්කළා. එහෙමම ඇඟිල්ලෙන් පුංචි ඉඟියක් කළා. එයා ඒ කිව්වේ,

MusesBooks
www.musesbooks.com

Copyrighted Material



මට ආයෙම වාඩිවෙන්න කියලා. ඉතින් මං එහෙම කළා. එයා කිව්ව විදියටම වාඩිවුණා.

මට කලින් දැනුණු දේ, මම අනුමාන කරපු දේ හරි කියලා දැනගත්තාම, සැහැල්ලුවක් දැනුණා. ඒත් තැබෑරුම හිස්වෙන්න, හිස්වෙන්න මගෙ හිතට දැනෙන කලබල ගතියත් වැඩිවෙන්න ගත්තා. එයා හිතන්නෙ මම වැඩුණු ගෑනියක් කියලා. ඒත් මට යන්තම්වත් වැඩිහිටි හැඟීමක් දැනෙන්නෙ නැති තරම්. ඇත්තම කියනවා නම්, මට දැනෙන්නෙ මං අවුරුදු විසිහයක, කිසිම අත්දැකීමක් නැති, බිංදුවේ ඉඳන් පටන්ගන්න සිද්දවෙලා තියෙන නවයොවුන් වයසේ කෙල්ලෙක් වගේ.

මම මෙහෙට ආවේ හොඳ හේතුවක් තිබිලද කියලා මට විශ්වාසයක් නෑ. තැබෑරුම ඇතුළට ගිහින්, එයාට පොඩ්ඩක් ඉඟිබිඟි ටිකක් පාලා, ඊටපස්සෙ මුකුත් වුණේ නෑ වගේ පිටවෙලා යන්න පුළුවන් වෙයි කියලයි මම හිතුවේ. ඒත්, මිලෙන් වැඩි කෝපි එකකටත් වඩා... සුකුරුත්තන් කෝපි එකකටත් වඩා එයා පොලඹවනසුලුයි. හිත නොමඟ යවනසුලුයි. මං මෙහාට ආවේ එයාව ප්‍රතික්ෂේප කරන්න හිතාගෙන බව ඇත්ත. ඒත් ඉතින් එයා මුළු රෑම එක එක දේවලට ඇඟිල්ල දික් කර කර ඉඳීවි කියලා මම දැනගෙන හිටියෙ නැනෙ! එයා මගේ දිහාට ඇඟිල්ල දික්කරාවි කියලා මට පොඩිම අදහසක්වත් තිබුණා කියලද? ඇඟිල්ල දික්කරලා, මොනවාහරි පෙන්නන එක සරාගී වෙන්න පුළුවන් දෙයක් කියලා කවුද දන්නේ?

මීට අවුරුදු පහකට කලිනුත්, මම ඒක සරාගී දෙයක් කියලා හිතන්න ඉඩ තිබුණද? එහෙම නැත්නම්, මම ලේසියෙන්ම සතුටු කරන්න පුළුවන්, අනුකම්පා කරන්න ඕනෙ දුක්ඛිත ගැහැනියක් ගාණට වැටිලද?

මැදියම් රෑ වෙනකොට, අපි දෙන්නා විතරයි තැබෑරුම ඇතුළේ ඉතුරු වුණේ. වැඩ කරන අනෙක් අය සේරම පිටවෙලා ගිහින්. ඉස්සරහ දොර වහලා. එයා හිස් වීදුරු පුරවපු පෙට්ටියක් බාර් එකේ පිටිපස්සේ කොටසට ගෙනියන ගමන් හිටියේ.

මම කකුල් දෙක උඩට අරගෙන, අත් දෙකෙන් ඒවා බදාගත්තා. මගේ හිත කලබල වෙලා තියෙන්නෙ. මම මේ නගරෙට ආවේ පිරිමියෙක්ව මුණගැහෙන්න නෙවෙයි. මට ඊට වඩා විශාල අරමුණක් තියෙනවා. ඒත් මේ හාදයට නිකන්ම නිකන් ඇඟිල්ලක් දික්කරලා

www.musesbooks.com

Copyrighted Material



විතරක්, ඒ අරමුණට යන පාරෙන් මාව එළියට ඇදලා දාන්න පුළුවන්!

ඒත් ඉතින්, මාත් මනුස්සයෙක්නේ. මිනිස්සුන්ට ආශ්‍රය කරන්න කවුරුහරි ඉන්න ඕනේ. මම මේ නගරෙට ආවේ මිනිස්සුන්ව මුණගැහෙන්න නොවුණත්, මේ හාදයව මායිම් නොකර ඉන්න එක ලේසි නෑ.

පියන් දෙකක් තියෙන දොරෙන් එයා ඒ ගමන මතුවුණේ වෙන කමිසයක් ඇඳගෙන. වැඩ කරන අය අඳින, අර දම් පාට කොලර් එකකුයි, උඩට රෝල් කරපු කමිස අතුයි තියෙන කමිසෙ වෙනුවට, දැන් එයා ඇඳගෙන ඉන්නෙ සුදු පාට ටී-ෂර්ට් එකක්. හරිම සරල, ඒ වගේම, හරිම සංකීර්ණ ඇඳුමක්!

මගේ දිහාට එනගමන් එයා මාත් එක්ක හිනාවුණා. ඒක හරි උණුසුම් හිනාවක්. බර, උණුසුමෙන් පිරුණු පොරෝනාවකින් මාව වෙළාගන්නවා වගේ හැඟීමක් අරන් ආව හිනාවක්.

"ඔයා ආපහු ආවා එහෙනම්."

මම වෙනසක් නොපෙන්වා ඉන්න උත්සාහ කළා. "ඔයා මට එන්න කිව්වනේ!"

"ඔයා මොනවහරි බොනවද?'

"දැන් එපා."

එයා කොණ්ඩ කැරැලි අතරින් අත යවලා, ඒවා පිටිපස්සට කරගන්න ගමන්, මගේ දිහා බලාගෙන හිටියා. තවමත් හිටගෙනම ඉඳපු එයාගෙ ඇස් ඇතුළෙ යුද්ධයක් සිද්දවෙමින් තිබුණා. මම කියලත් ඉතින් ස්විට්සර්ලන්තය වගේ සාමකාමී වුණේ නෑ. ඒත් ඒකෙන් ඔහු මගේ ළඟට එන එක වැළකුණේ නෑ. හරියටම මගේ එහා පැත්තෙන් එයා වාඩිවුණා. මගේ හදවත වේගයෙන් ගැහෙනවා. කොයිතරම් වේගෙන්ද කියනවා නම්, අවුරුදු බර ගාණකට කලින් ස්කොටී හතරවෙනි වතාවටත් මගේ කවුන්ටරේට ආව දවසටත් වඩා වේගයෙන්!

"ඔයාගෙ නම මොකක්ද?" එයා අහනවා.

එයා මගේ නම දැනගන්න ඕනෙ නෑ. ස්කොටී ජීවතුන් අතර හිටියා නම්, එයත් මේ වයසෙම වෙයි කියලා හිතෙන පෙනුමක් තමයි මේ මනුස්සයට තියෙන්නේ. ඒ කියන්නෙ, මගේ නම මොකක්ද කියලා, එහෙම නැත්නම්, මම කවුද කියලා එයා දැනගෙන ඉන්න ඉඩ තියෙනවා. එහෙම නැත්නම්, ඉස්සර සිද්දවුණු දේවල් ගැන

MUSESBOOKS®

Copyrighted Material



වුණත්! මට ඕනෙ වුණේ නෑ, කිසිම කෙනෙක් මං ගැන දැනගන්න. නැත්නම්, කාටවත් මාව මතක තියෙන්න. ඔය සේරමට වඩා, මම ආයෙමත් නගරෙට ඇවිල්ලා කියලා ලැන්ඩ්‍රිලාට අනතුරු අඟවන්න මට කිසිම වුවමනාවක් නෑ.

මේක පොඩි නගරයක් නෙවෙයි තමා. ඒත් ඉතින් මහ විශාල එකකුත් නෙවෙයිනේ. මම මෙහේ ඉන්නවා කියන කාරණාව වැඩි කාලයක් හැංගිලා තියෙන එකක් නෑ. ඒත් මට ඕනේ පුළුවන් තරම් කාලයක්, ඇති තරම් දිග කාලයක් කාගෙවත් ඇස්වලට අහු නොවී ඉන්න. ඉතින් මම එයාට බොරුවක් කිව්වා. බොරුවක් කිව්වට බොරුවක්මත් නෙවෙයි. මං එයාට මගෙ නමේ මැද කොටස කිව්වා.

"නිකොල්."

මම එයාගෙ නම මොකක්ද කියලා අහන්න ගියේ නෑ. මට වැඩක් නෑනේ! මං ආයෙ කවදාවත් ඕක පාවිච්චි කරන්නෙ නැති එකේ, අහන එකේ තේරුමක් නෑ. මං අද රැයින් පස්සේ, ආයෙ කවදාවත් මෙහෙ එන්නෙ නැති වේවි.

කවුරුහරි මට මේ තරම් ළං වෙලා ඉන්නෙ, ශතවර්ෂයක් තරම් දැනෙන දීර්ඝ කාලයකට පස්සේ. ඒකෙන් මගේ හිත කලබල කරනවා. ඉතින් මං මගෙ කොණ්ඩ කැරැල්ලක් අදින්න ගත්තා. මං කරන්න ඕනෙ මොනවද කියලා මටම අමතක වෙලා වගේ. ඉතින් මං කියන්න හිතාගෙන ආව දේ, ගඟෙන් ගෙඩි එන්නා වගේ එකපාරටම කියලා දැම්මා.

"මං ඒක බොන්න නෙවෙයි හිටියේ."

එයා ඔළුව පැත්තකට ඇල කළේ, මගේ පාපෝච්චාරණයෙන් අන්දමන්ද වෙලා. ඉතින් මං පැහැදිලි කළා.

"වයින්. සමහර වෙලාවට මං..." මං ඔළුව දෙපැත්තට හෙලෙව්වා. "මේක මේ මෝඩ දෙයක් තමයි. ඒත් මං සමහර වෙලාවට මේ වැඩේ කරනවා. ඒ කියන්නෙ, මම ඇල්කොහොල් ඕඩර් කරලා, ඒක නොබී අතෑරලා දාලා යනවා. මං ඇල්කොහොල් ඕඩර් කරන්නෙම, ඒ විදියට ඇත්වෙලා යන්නමයි. මට බොන්න බැරි විදියේ ප්‍රශ්නයක් නෑ. මං හිතන්නෙ, ඒක වැඩිපුරම පාලනය ගැන තියෙන ප්‍රශ්නයක්. ඒකෙන් මට, මං දුර්වලයි කියලා හිතෙන එක අඩු කරනවා."

යන්තමට මතුවුණ හිනාවක ඡායාවක් එක්ක, එයාගේ ඇස් මගේ මූණ පුරාම එහෙට මෙහෙට ගියා. "මං ඒකට ගරු කරනවා." එයා කිව්වා. "මමත් ඔය විදියෙම හේතුවක් නිසා, හරිම කලාතුරකින්

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



තමයි සැර ජාති බොන්නෙ. මම හැම රෑකම, බීපු මිනිස්සු අතරේ ගැවසෙනවා. මං එයාලා අතර වැඩි වැඩියෙන් ඉන්න තරමට, මට එයාලගෙන් කෙනෙක් වෙන්න තියෙන වුවමනාව එන්න එන්නම අඩුවෙනවා.”

“බොන්නෙ නැති බාර්-ටෙන්ඩර් කෙනෙක්? ඒක නම් හරිම කලාතුරකින් අහන්න ලැබෙන දෙයක්. එහෙම නේද? මං හිතන් හිටියෙ ඇල්කොහොල් බොන්න වැඩියෙන්ම ඇබ්බැහි වෙලා ඉන්නෙ බාර්-ටෙන්ඩර්ලා කියලා. එයාලට හරිම ලේසියෙන් ගන්න පුළුවන්නෙ!”

“ඇත්තටම වැඩිපුරම බොන්නේ ඉදිකිරීම් අංශෙ ඉන්න අය. මගේ හැටියට නම් ගැළපෙන්නෙම නැති රස්සාවක්. මං දැන් අවුරුදු ගාණක ඉඳන්, තවම එකම ගේ හදනගමන් ඉන්නේ.”

“ඔයා නම් ඇත්තටම, විහින් අමාරුවේ වැටෙන්න යන පාටයි!”

“ඒ වගේ තමයි පේන්න තියෙන්නෙ,” එයා හිනාවෙලා කියන ගමන්, තව ටිකක් හොඳට පුටුවේ හරිබරිගැහිලා වාඩිවුණා. “ඔයා මොනවද කරන්නෙ නිකොල්?”

මේ තමයි මම මෙතැනින් නැඟිටලා යන්න ඕනෙ වෙලාව. එයා තව වැඩිපුර ප්‍රශ්න අහන්න පටන්ගන්න කලින්. මට ඕනෙවට වැඩිය දේවල් කියවෙන්න කලින්. ඒත් මං එයාගෙ කටහඬට ආසයි, එයා මෙතන ඉද්දි දැනෙන හැඟීමට ආසයි. මෙහේ ඉන්න එකෙන් මගේ අවධානය වෙනස් වෙනවා කියලා මට දැනෙනවා. දැන්, මේ වෙලාවෙ මට ඕනෙත් ඒකම නෙවෙයිද? ඔව්, මට මේ වෙලාවේ ඒ විදියේ අවධානය වෙනස් කරන දෙයක්, මගේ හිත වෙන දිශාවකට ඇදගෙන යන දෙයක් ඕනේ. තදබල විදියට මට ඒ අවශ්‍යතාවය දැනෙනවා.

එකම දේ, මට කතාකරන්න ඕනෙ නෑ. මාව මේ නගරෙදි අමාරුවේ වැටෙන්න පුළුවන් ලේසිම විදිය, කතාකිරීම.

“මං කරන්නෙ මොනවද කියලා ඔයාට ඇත්තටම දැනගන්න ඕනෙද?” මේ වගේ වෙලාවක කෙල්ලෙක්ට කියන්න තියෙන දේ මොකක් වුණත්, ඒවා අහගෙන ඉන්නවට වඩා, මගේ ටී-ෂර්ට් එක උඩින් අත තියාගන්න එයා කැමති වෙයි කියලා මට හොඳටම විශ්වාසයි. අවුරුදු පහක් තිස්සේ සිරගත වෙලා ඉන්න සිද්දවුණු නිසා, මං තවම කිසිම රස්සාවක් කරන්නෙ නෑ කියලා එයා ඉස්සරහ

www.musesbooks.com

Copyrighted Material



පිළිගන්න මට ඕනෙකමක් නෑ. ඉතින් මං හෙමින්, එයාගේ උකුළ උඩට ලිස්සලා ගියා.

ඒකෙන් එයා ඇත්තටම පුදුම වුණා. හරියට නිකන්, අපි තව පැයක්ම මෙතන වාඩිවෙලා, ඔහේ කතා කර කර ඉඳීවි කියලා එයා ඇත්තටම හිතාගෙන හිටියා වගේ.

තරමක කම්පනයක ඉඳන්, මං ඒ කරපු දේ පිළිගැනීම දක්වා එයාගෙ මූණේ ඉරියව් ක්‍රමයෙන් වෙනස් වුණා. එයාගේ අත් මගේ ඉඟ වටේට වෙළිලා, තදින් අල්ලගත්තා. ඒ ස්පර්ශයෙන් මාව වෙවුලලා ගියා.

එයා මාව එහෙ මෙහෙ කරලා, එයාගෙ උකුළේ තව ටිකක් උඩට එන විදියට හදාගත්තා. එයාගෙ ඩෙනිම් කලිසමට යටින් තියෙන උණුසුම මට දැනෙනවා. මීට තත්පර පහකට කලින්, මෙතැනින් පිටවෙලා යන්න මට පුළුවන් කියලා තිබුණ විශ්වාසය, එකපාරටම නැතිවෙලා ගිහින්. තවදුරටත් මට ඒ ගැන විශ්වාසයක් නෑ. එයාව සිපගෙන, සුබ රාත්‍රියක් පතලා, ඊටපස්සෙ පපුව පුරාම පිරුණු ආඩම්බරයක් එක්ක, හෙමින් ගෙදරට ඇවිදගෙන යන්න මට පුළුවන් වෙයි කියලයි මං හිතුවේ. හෙට දවස උදාවෙන්න කලින්, මං බලසම්පන්නයි කියන හැඟීම යන්තමින් හරි විඳගන්න විතරයි මට වුවමනා වුණේ. ඒත් දැන් මේ මොකක්ද වෙන්නෙ? එයාගෙ ඇඟිලිතුඩු මගේ ඉණ හරියෙ සම උඩින් ඇදීගෙන යද්දි, මං තව තවත් දුර්වල වෙනවා. හෙණ ගහලා වගේ, මගේ සිතිවිලි සේරම ශූන්‍ය වෙනවා! ඒක මේ කිසිම දෙයක් ගැන සැලකිල්ලක් නැතිවෙන විදියේ, සිතිවිලි ශූන්‍යවීමක් නෙවෙයි. මගේ ඔළුව ඇතුළ හිස්වෙලා, මගේ පපුවට හැමදෙයක්ම දැනෙන විදියේ සිතිවිලි ශූන්‍යවීමක්. හරියට මගෙ ඇතුළේ ගිනිබෝලයක් ඇතිවෙමින් තියෙනවා වගේ. ඔව්, එහෙමයි ඒක දැනුණේ.

එයාගෙ දකුණු අත මගේ පිට දිගේ උඩට ඇදීගෙන යනවා. ඒ ස්පර්ශයෙන් උත්පාදනය වුණු විදුලිමය සංවේදනයක් මගේ මුළු ශරීරය හරහා ඇදිලා ගිය බව දැනුණු මොහොතේ, මගේ හුස්ම හිරවුණා. මේ තරුණයා දැන් අල්ලන්නෙ මගේ මූණ. මගේ කොපුල් අස්ථිය දිගේ පහතට ආව එයාගෙ ඇඟිලි, එතැනින් මාරු වුණේ මගේ තොල් දිහාවට. හරියටම කියනවා නම් ඇඟිලිතුඩු, ඔව්... මගේ තොල් උඩ යන්තමින් ස්පර්ශ කරන්නෙ එයාගෙ ඇඟිලිතුඩු. ඒ ඇස්

www.musesbooks.com

Copyrighted Material



මගේ දිහාටම එල්ලවෙලා තිබුණේ, එයා මාව කලින් කොහේදිද දැකලා තියෙන්නෙ කියලා මතක් කරගන්න උත්සාහ කරනවා වගේ.

සමහරවිට මේ හැමදෙයක් දිහාම සැකයෙන් බලන මගේ මනස වැඩ අල්ලලා වෙන්න ඇති.

"කවුද ඔයා?" එයා කෙඳිරිලි හඬකින් ඇහුවා.

මම එයාට දැන් එක වතාවකුත් මගේ නමේ මැද කොටස කිව්වා තමයි. මම හිත හදාගෙන ආයෙම ඒ උත්තරේම දුන්නා. "නිකොල්."

එයා හිනාවුණා. හැබැයි ඊළඟ මොහොතේ ඒ හිනාව තුනීවෙලා ගිහින්, ඔහු ආයෙම මෙහෙම කිව්වා. "මම ඔයාගෙ නම දන්නවා. ඒත් මං අහන්නෙ, ඔයා කොහේ ඉඳන්ද ආවේ? ඇයි අපි මීට කලින් කවදාවත් හමු නොවුණේ?"

මට එයාගෙ ප්‍රශ්නවලට දෙන්න අවංක උත්තරයක් නෑ. ඉතින් මට ඒවා අහන්න ඕනෙ නෑ. මං එයාගෙ තොල්වලට තව පොඩ්ඩක් ළං වුණා. "ඔයා කවුද?"

"ලෙජර්."

එයා කිව්වේ, මං වහගෙන ඉඳපු සම්පූර්ණ අතීතයම ඉරලා විවෘත කරගෙන, මගේ හදවතේ ඉතුරුවෙලා තිබුණු හැමදෙයක්ම එළියට ඇදලා, පොළොවට අතහරිනගමන්. ඊළඟට එයා මාව සිපගත්තා.

* * * *

මිනිස්සු ආදරෙන් බැඳෙනවා කියන එකට *'fall in love'* කියලා කියනවා. ඒත් ඇත්තටම හිතලා බැලුවම මේ *fall* කියන වචනේ මහා දුක්බර වචනයක්. *Falls*, එහෙම නැත්නම් වැටීම්, කවදාවත් හොඳ දේවල් වෙන්නෙ නෑ. නිකමට හිතන්නකෝ, *Fall on the ground* කිව්වම, ඒකෙන් කියන්නෙ බිමට වැටෙනවා. ආයෙ තව *fall behind* කිව්වොත්, පසුබහිනවා, අනික් අයට වඩා මන්දගාමී වෙනවා කියන එකයි ඒකෙන් කියන්නෙ. එහෙම නැත්නම්, *fall to your death*, ඒ කියන්නෙ මරණීය විදියට වැටෙනවා.

*'Fall in love'* කියලා මුලින්ම කිව්ව කෙනා කවුරු වුණත්, එයා එහෙම කියන වෙලාවෙත් ආදරෙන් අහකට වැටිලයි ඉන්න ඇත්තේ. නැත්නම්, එයාට ඕක ඊට වඩා හොඳ විදියකට කියන්න තිබුණනේ!

www.musesbooks.com

Copyrighted Material



අපේ සම්බන්ධය මඟක් දුර යද්දිම, එයා මට ආදරේ කරන්න ගත්ත බව ස්කොටී මට කිව්වා. එදා රෑ තමයි මම එයාගෙ හොඳම යාළුවව පළවෙනි පාරට මුණගැහෙන්න නියමිත වෙලා තිබුණෙ. මම ඒ වෙද්දිත් එයාගේ දෙමව්පියො හමුවෙලා තිබුණා. එයා ඒකට හුඟක් සතුටු වුණා තමයි. හැබැයි තමන්ගෙම සහෝදරයෙක් වගේ සලකපු මේ හාදයව මට මුණගස්වන්න එයාට තිබුණු උනන්දුව, සතුට ඒ අහලකින්වත් තියන්න බෑ.

ඒ හමුවීම කවදාවත් සිද්දවුණේ නෑ. ඒ ඇයි කියලා මට හරියටම මතක නෑ. ඒ ඉතින් හුඟ කාලෙකට ඉස්සරනේ. ඒත් කොහොමහරි එයාගෙ යාළුවට එදා හමුවීම හදිසියේ අවලංගු කරන්න සිද්දවෙලා තිබුණා. ස්කොටී ඒ ගැන හොඳටම හිත රිද්දගෙන හිටපු හන්දා, මම එයාට කුකීස් හදලා දුන්නා. ඊටපස්සෙ අපි දෙන්නම කංසා සුරුට්ටුවක් ඇද්දා. ඒක ඉවර වුණාම, මං එයාට බ්ලෝජොබ් එකකුත් දුන්නා. එයාට ඉඳපු හොඳම පෙම්වතිය!

*ඒ, මං එයාව මරනකල් විතරයි.*

මේක සිද්දවුණේ එයා මැරෙන්න මාස තුනකට කලින් දවසක රෑ. එදා එයා හිටියෙ හුඟක් දුකින් තමයි. හැබැයි ගහක් ගලක් තරමට පණපිටින්. ඒත් ස්කොටී ඇස්වල කඳුළු පුරවගෙන, *'මං ඔයාට හුඟක් ආදරෙයි කෙනා. මේ තාක් වෙන කිසිම මනුස්සයෙකුට කරලා නැති තරමට, මම ඔයාට ආදරෙයි. මට ඔයාව කොයිතරම් මතක් වෙනවද කියනවා නම්, අපි ළඟින් ඉන්න වෙලාවල පවා, මට ඔයා නැති පාළුව දැනෙනවා,'* කියද්දි, එයාට ගැහෙන හදවතකුයි, වේගවත් නාඩියි එක්ක උස් පහත්වෙන පපුවකුයි තිබුණා.

එයා ඒ කිව්ව වචන ටික මගෙ හිතේ ඒ විදියටම රැඳිලා තියෙනවා. *'මට ඔයාව කොයිතරම් මතක් වෙනවද කියනවා නම්, අපි ළඟින් ඉන්න වෙලාවල පවා, මට ඔයා නැති පාළුව දැනෙනවා.'*

එදා රෑ ස්කොටී කිව්ව දේවල්වලින් මගේ හිතේ රැඳිලා තියෙන්නෙ, ඒ වචන ටික විතරයි කියලයි මම හිතුවේ. නෑ, මට වැරදිලා. තව දෙයක් මගේ හිතේ ඒ විදියටම රැඳිලා තිබිලා තියෙනවා.

නමක්.

*ලෙජර්.*

හමුවට ආවේ නැති එයාගේ හොඳම යාළුවා!

කවදාවත් මට මුණගැහෙන්න බැරිවුණ එයාගේ හොඳම යාළුවා!

MUSESBOOKS®

Copyrighted Material



මේ දැන් මගේ තොල් අතරින් එයාගෙ දිව රිංගවලා, මගේ ටී-ෂර්ට් එක උඩින් අත රඳවපු, මගේ පපුවේ නම ලියැවිලා තියෙන එයාගේ හොඳම යාළුවා!

MusesBooks®

www.musesbooks.com